# මැතිවරණ ක්‍රම සැලසුම් කිරීම

**ප්‍රජාතන්ත්‍රවාදය හා මැතිවරණ ක්‍රම සඳහා සහාය වීමේ
ජාත්‍යන්තර ආයතනයේ අත් පොත පිළිබඳ
කෙටි විමසුමක්**

මෙම කෙටි විමසුමට ප්‍රජාතන්ත්‍රවාදය හා මැතිවරණ ක්‍රම සඳහා සහාය වීමේ ජාත්‍යන්තර ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති මැතිවරණ ක්‍රම සැලසුම් කිරීම 2005: නව ජාත්‍යන්තර අයිඩීඊඒ අත් පොත (ISBN 91-85391-35-2) පදනම් වී ඇත

මැතිවරණ ක්‍රම තෝරා ගැනීමේ මූලික සිද්ධාන්ත සහ විකල්ප මැතිවරණ ක්‍රම සතු ගුණ අගුණ සහ ආයතන සැලසුම්කරුවන් සඳහා වූ උපදෙස් පිළිබඳ කෙටි විස්තරයක් මෙහි අඩංගු වේ. මුල් අත් පොතේ සඳහන් නිදර්ශන සහ විෂයානුබද්ධ අධ්‍යයන ඉවත් කර ඇති අතර විවිධ කරුණු සනාථ කිරීමේ තර්ක විතර්ක යනාදිය ලඝුකොට දක්වා තිබේ.

**'මැතිවරණ ක්‍රම සැලසුම් කිරීම 2005 කෘතිය'**

ප්‍රජාතන්ත්‍රවාදය සහ මැතිවරණ ක්‍රම සඳහා සහාය වීමේ ජාත්‍යන්තර ආයතනයේ Electoral System Design 2005 කෘතියේ ඍජු පරිවර්තනයකි.

පරිවර්තනයේ නිරවද්‍යභාවය පිළිබඳ සැකයක් ඇති වූ විට දී මුල් ඉංග්‍රීසි පිටපතෙහි (අන්තර්ගතය වලංගු වේ.

සිංහල පරිවර්තනයේ භාරකාරත්වය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සතු වේ.

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**
24/2, 28 වැනි පටුමග, මල් පාර, කොළඹ 07.
දුරකථනය : 011-2565304-06
ෆැක්ස් : 011-4714460
වෙබ් අඩවිය : www.cpalanka.org
ISBN : 91-85391-77-8

ජාත්‍යන්තර අයිඩීඊඒ ප්‍රකාශන නිශ්චිත ජාතික හෝ දේශපාලන අවශ්‍යතා නියෝජනය නොකරයි. මෙම ප්‍රකාශනයේ දැක්වෙන අදහස් අවශ්‍යයෙන් ම ජාත්‍යන්තර අයිඩීඊඒ ආයතනයේ හෝ එහි පාලනාධිකාරියේ හෝ එහි නියෝජිතයින්ගේ හෝ අදහස් නොවනු ඇත.

මෙම ප්‍රකාශනයේ අඩංගු සිතියම් වෙතින් කුමන හෝ භූමි ප්‍රදේශයක නෛතික තරාතිර ම හෝ ඒවායේ දේශ සීමා මායිම් අනුමත කිරීමක් පිළිබඳව ආයතනයේ දේශපාලන මතය ප්‍රකාශ නොවේ.

එසේ ම, කුමන හෝ රටක් හෝ භූමි ප්‍රදේශයක් ස්ථානගත කිරීම හෝ එහි විශාලත්වය වෙතින් මෙම ආයතනයේ දේශපාලන මතය නිරූපනය නොවේ.

හුදෙක් කරුණු පැහැදිලි කිරීමේ අරමුණින් මෙම සිතියම් සකසා ඇත.

C ප්‍රජාතන්ත්‍රවාදය හා මැතිවරණවලට සහායවීමේ ජාත්‍යන්තර ආයතනය 2005

මෙම ප්‍රකාශනය හෝ ඉන් කුමන හෝ කොටසක් ප්‍රත්‍යුත්පාදනය කිරීම හෝ පරිවර්තනය කිරීම අවශ්‍ය වේ නම් ඒ සඳහා අනුමැතිය පහත සඳහන් ආයතනයෙන් ලබා ගැනීම මැනවි.

ප්‍රකාශන කාර්යාලය
ජාත්‍යන්තර අයිඩීඊඒ
එස්ඊ-10334 ස්ටොක්හෝම්
ස්වීඩන්

පිටකවරය සහ සිතියම් සැලසුම් කිරීම : මැග්නස් අල්ක්වාර්

පිටකවරයේ ඡායාරූපය (සී) - ප්‍රිසෙන්ස් බිල්ඩ්

පොත සැලසුම් කිරීම : රොබින් ඩටෙන්ෆෙල්ට්

මුද්‍රණය : බුල්ස් ටිකේරි, ස්වීඩනය

ISBN 91-85391-77-8

# පටුන


| | |
|---|---|
| මැතිවරණ ක්‍රමයක් තෝරාගැනීම | 4 |
| මැතිවරණ ක්‍රම යනු කුමක් ද? | 5 |
| මැතිවරණ ක්‍රම සැලසුම් කිරීමේ ප්‍රමිතීන් | 8 |
| මැතිවරණ ක්‍රම සැලසුම් කිරීමේ ක්‍රියාවලිය | 13 |
| මැතිවරණ ක්‍රමයක් තෝරාගැනීම | 15 |
| මැතිවරණ ක්‍රමවලින් අත්වන වාසි හා අවාසි | 19 |
| නියෝජනය සහ පරිපාලනය : වැදගත් කරුණු කීපයක් | 22 |
| මැතිවරණ ක්‍රම සහ දේශපාලන පක්ෂ | 24 |
| පසුවදන - විවිධ විකල්ප සහ මූලධර්ම | 25 |
| මැතිවරණ ක්‍රම සැලසුම් කිරීමේ දී පරීක්ෂාවට ලක්විය යුතු ප්‍රධාන කරුණු | 30 |
| ගැටපද විවරණය | 31 |

**මැතිවරණ ක්‍රමයක් තෝරා ගැනීම ප්‍රජාතන්ත්‍රවාදයේ සාධනීය වර්ධනය අරමුණු කොටගත් අතිශය වැදගත් තීරණයකි.**

**මැතිවරණ ක්‍රමයක් ස්ථාපනය කළපසු එමගින් රටක දේශපාලන ජීවිතයට මහඟු බලපෑමක් සිදුවනවා නොඅනුමාන ය.**

**තෝරාගත් මැතිවරණ ක්‍රමය යම් ප්‍රශ්නයකට දෙන ලද "නිවැරදි පිළිතුරක්" වශයෙන් පටු නිගමනයකට පිවිසිය නොහැකි අතර සැබැවින් ම එය මූලික දේශපාලන ක්‍රියාවලියක් වශයෙන් සැලකිය හැකිය.**

**සියලු දේශපාලන ආයතන අතුරින් විශේෂයෙන්, මැතිවරණ ක්‍රම බෙහෙවින් වැදගත්වන අතර රටේ පාලනයට අදාළ පුළුල් විෂයයන් සම්බන්ධයෙන් ඉතාමත්ම ප්‍රයෝජනවත් වේ.**

## මැතිවරණ ක්‍රමයක් තෝරා ගැනීම

මැතිවරණ ක්‍රමයක් තෝරාගැනීම ප්‍රජාතන්ත්‍රවාදයේ සාධනීය වර්ධනය අරමුණු කොටගත් අතිශය වැදගත් තීරණයකි. යම් රටක් තුළ කිසියම් මැතිවරණ ක්‍රමයක් ස්ථාපනය කළ පසු එමගින් එහි දේශපාලන ජීවිතයට මහඟු බලපෑමක් සිදුවනවා නො අනුමාන ය. වරක් ස්ථාපනය කරන ලද මැතිවරණ ක්‍රමය රට තුළ දිගින් දිගට සවිබල ගැන්වෙමින් පවතිනු ඇත. එසේම තෝරාගත් මැතිවරණ ක්‍රමයක් වෙතින් විවිධ අපේක්ෂිත හා අනපේක්ෂිත ප්‍රතිඵල ඇතිවීමට ද ඉඩ ඇත. තෝරාගත් මැතිවරණ ක්‍රමය යම් ප්‍රශ්නයකට දෙන ලද ''නිවරැදි පිළිතුරක්'' වශයෙන් පටු නිගමනයකට පිවිසිය නොහැකි අතර සැබවින් ම එය මූලික දේශපාලන ක්‍රියාවලියක් වශයෙන් සැලකිය හැකි ය.

මැතිවරණ ක්‍රමයක් තෝරා ගැනීමේ දී දේශපාලන වාසි කෙරෙහි නැඹුරුවීමේ ප්‍රවනතායක් දකිත හැකි ය. කෙටි කාලීන දේශපාලන වාසි කෙරෙහි උනන්දුවීම නිසා මැතිවරණ ක්‍රමයක් තුළින් දීර්ඝ කාලීන වශයෙන් සිදුවිය හැකි ප්‍රතිඵල අහෝසි වීමට ඉඩ ඇත. මැතිවරණ ක්‍රමයකින් පුළුල් දේශපාලන සහ ආර්ථික ව්‍යුහයට සැලකිය යුතු බලපෑමක් සිදුකළ හැකි ය. කොයිම රටක හෝ මැතිවරණ ක්‍රමයක් තනි ආයතනයක් වශයෙන් විමර්ශනයට ලක් කළ නොහැකි අතර, ඉන් ඇතිවන බලපෑම සහ එහි ආකෘතිය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සහ ඉන් බාහිර අනෙකුත් විවිධ ව්‍යුහයන් මත බොහෝ දුරට රඳා පවතිනු ඇත. සමස්තයක් වශයෙන් පවත්නා දේශපාලන ආයතනවල ව්‍යුහය අවධානයට ලක් කිරීම මගින් වඩාත් සාර්ථක මැතිවරණ ක්‍රමයක් සඳහා ආකෘතියක් නිර්මාණය කළ හැකි ය. මෙම ව්‍යුහය තුළ යම් වෙනසක් සිදු කළහොත් එයට සම්බන්ධ අනෙකුත් ආයතනවලට ද එය බෙහෙවින් බලපානු ඇත. නිදර්ශනයක් වශයෙන් පක්ෂ නායකයින් සහ ක්ෂෙත්‍රයේ ක්‍රියාකාරීන් අතර ඇතිවන ගැටුම් නිරාකරණය කිරීමේ දී තෝරා ගන්නා ලද මැතිවරණ ක්‍රමය එයට උපකාරී වන්නේ කෙසේ ද? පක්ෂයෙන් තේරී පත් වූ නියෝජිතයින් සම්බන්ධයෙන් කවර පාලනයක් පක්ෂ නායකයින් සතුව තිබේ ද?

ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ඌණ පූරණය කරනු ලබන ජනමත විචාරණය, සහ පුරවැසි මූලික සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වැනි උපයා මාර්ග සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් විශේෂ විධිවිධාන සලසා තිබේ ද? මැතිවරණ ක්‍රමය හා ඒ පිළිබඳ විධිවිධාන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුළ ප්‍රධාන වශයෙන් අන්තර්ගත වී තිබේ ද? නැතහොත්, විශේෂ උපලේඛනයක් වශයෙන් ඇතුළත් කර තිබේ ද? යන මේ කරුණු අනුසාරයෙන් මැතිවරණ ක්‍රමය පහසුවෙන් වෙනස් කළ නොහැකි ආකාරයට ස්ථාපිත වී තිබේ ද? නැතහොත්, තේරී පත් වූ බහුතරයට එය වෙනස් කිරීම සඳහා කෙතරම් දුරට ඉඩකඩ විවෘතව තිබේ ද යන්න නිගමනය කිරීමට හැකි වේ.

මධ්‍යගත කිරීමේ ක්‍රියාවලියේ දී යා හැකි සීමාව සහ පාර්ලිමේන්තු ක්‍රමය සහ ජනපති ක්‍රමය යන දෙක අතුරින් සුදුසු එකක් තෝරාගැනීම අතිශය වැදගත් කරුණු දෙකකි.

රට තුළ ඇත්තේ ඒකීය හෝ පෙඩරල් මාදිලියේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් ද සහ එය පෙඩරල් ව්‍යවස්ථාවක් නම් ඒ යටතේ පෙඩරල් ඒකක සඳහා බලය ලබා දී ඇත්තේ අසමමිතික හෝ සමමිතික පදනමක් යටතේ ද?

මැතිවරණ ක්‍රමයක් සැලසුම් කිරීමේ දී විධායක හා ව්‍යවස්ථාදායක ආයතන අතර පවත්නා සම්බන්ධතාව එම අංශ දෙකට ම බෙහෙවින් වැදගත් වේ. මහජනතාවගේ ඡන්දයෙන් සෘජුව ම තේරී පත් වූ ජනාධිපතිවරයකුට ව්‍යවස්ථාදායකයෙන් ප්‍රමාණවත් සහයෝගයක් නොලැබෙන්නේ නම් යහපත් අයුරින් රටේ පාලන කටයුතු කරගෙන යාම ඔහුට අසීරු වනු ඇත.

ජනාධිපතිවරයා සහ ව්‍යවස්ථාදායකයා විසින් එකිනෙකට වෙනස් ආකාරයේ කාර්යභාරයක් ඉටු කරනු ලබුව ද, ජනාධිපති ක්‍රමය සහ අර්ධ ජනාධිපති ක්‍රමය සහිත ප්‍රජාතන්ත්‍රවාදයක් තුළ ජනාධිපති තනතුර සහ ව්‍යවස්ථාදායකය සඳහා වූ මැතිවරණ ක්‍රම එකට ගෙන සලකා බැලීම අවශ්‍ය වේ. ඒ සමගම මැතිවරණ එකවර පැවැත්වීම හෝ අන්‍යාකාරයෙන් සිදුකිරීම සහ දේශපාලන පක්ෂ කැබලිවලට කැඩීයාම මෙන් ම දේශපාලන පක්ෂ සහ තේරී පත් වූ මහජන නියෝජිතයින් අතර පවත්නා සබඳතා දිරිගන්වන හෝ පසුබෑමට ලක් කරන විධිවිධාන ඒ සමග ම සලකා බැලිය යුතුයි.

සියලු දේශපාලන ආයතන අතුරින් විශේෂයෙන් මැතිවරණ ක්‍රම බෙහෙවින් වැදගත් වන අතර රටේ පාලනයට අදාළ පුළුල් විෂයයන් සම්බන්ධයෙන් ඉතාමත් ම ප්‍රයෝජනවත් වේ. නිදර්ශනයක් වශයෙන් මැතිවරණ කොට්ඨාශයක් නියෝජනය කිරීම සහ සමානුපාතිකත්වය දියුණු කරලීම, ශක්තිමත් හා දෙපයින් නැගී සිටිය හැකි ජාතික දේශපාලනය සවිබල ගැන්වීම, කාන්තාවන් මෙන්ම කලාපීය සුළුජන කොටස් නියෝජනය කිරීම සහ සුවිශේෂ දිරිගැන්වීම් හා සීමා පැනවීම් යනාදිය නිර්මාණාත්මක වශයෙන් ප්‍රයෝජනයට යොදා ගැනීමෙන් බෙදී වෙන් වී ගිය සමාජයක් තුළ විවිධ ජන කොටස් අතර සහයෝගීතාවය සහ ඔවුන් සමාජ ප්‍රවාහයට අවශෝෂණය කරගැනීම යනාදී අරමුණු සඵල කර ගැනීම උදෙසා මැතිවරණ ක්‍රමය සැලසුම් කළ යුතු ය.

## මැතිවරණ ක්‍රමය යනු කුමක් ද?

මහ මැතිවරණයක දී මහජනතාව විසින් ප්‍රකාශ කරන ලද ස්වකීය ඡන්දය අවසානයේ දී දේශපාලන පක්ෂ සහ ඡන්දාපේක්ෂකයින් විසින් දිනාගන්නා ලද ආසන බවට පරිවර්තනය වීම මූලික වශයෙන් මැතිවරණ ක්‍රමයකින් සිදුවන කාර්යය වේ.

මැතිවරණ ක්‍රමය ප්‍රධාන විචල්‍යයන් තුනකින් සමන්විත වේ. එනම් ප්‍රථමයෙන් මැතිවරණ ආකෘතිය (බහුත්ව/බහුතර, මිශ්‍ර, සමානුපාතික හෝ වෙනත් සුවිශේෂ ක්‍රමයක් යොදා ගන්නේ ද යන්න සහ ආසන සංඛ්‍යාව වෙන් කිරීමේලා කුමණ ගණිත ක්‍රමයක් උපයෝගී කරගන්නේ ද?) දෙවනුව ඡන්ද පත්‍රිකාවේ ව්‍යුහය (ඡන්ද දායකයා යම් දේශපාලන පක්ෂයකට හෝ අපේක්ෂකයෙකුට ස්වකීය ඡන්දය ප්‍රකාශ කරන්නේද සහ එක් අපේක්ෂකයෙකු

**මහ මැතිවරණයක දී මහජනතාව විසින් ප්‍රකාශ කරන ලද ස්වකීය ඡන්දය අවසානයේ දී දේශපාලන පක්ෂ සහ ඡන්දාපේක්ෂකයින් විසින් දිනාගන්නා ලද ආසන බවට පරිවර්තනය වීම මූලික වශයෙන් මැතිවරණ ක්‍රමයකින් සිදුවන කාර්යය වේ....**

**සෑම ඡන්ද දායකයකු විසින් ම හරියටම තම එකම ඡන්දය ලබාදීමෙන් පසුව වුව ද, තෝරාගනු ලැබූ මැතිවරණ ක්‍රමය අනුව මැතිවරණයේ ප්‍රතිඵලය බොහෝ සෙයින් වෙනස් වනු ඇත...**

**සමහර මැතිවරණ ක්‍රම දේශපාලන පක්ෂ දිරිගන්වනවා පමණක් නොව, ඇතැම් අවස්ථාවන්හි දී ඒවා ක්‍රියාවට නැංවීම සඳහා සෘජුව ම දායක වෙයි.**

සඳහා කතිරය සලකුණු කරන්නේ ද? හෝ අපේක්ෂකයින් කීප දෙනෙකු සඳහා ස්වකීය මනාපය ප්‍රකාශ කරන්නේ ද?) සහ තෙවනුව දිස්ත්‍රික්කයේ විශාලත්වය (එනම් දිස්ත්‍රික්කයේ ඡන්දදායකයින් කොපමණ ජීවත් වන්නේ ද යන්න නොව, එම දිස්ත්‍රික්කය විසින් ව්‍යවස්ථාදායකයට නියෝජිතයින් කොපමණ සංඛ්‍යාවක් පත් කරන්නේ ද?) ආදි වශයෙනි.

මේ හැරුන විට මැතිවරණයක් හා සම්බන්ධ පරිපාලනමය කරුණු (එනම් මැතිවරණයක් පැවැත්වීමට අවශ්‍ය ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීම. අපේක්ෂකයින්ගේ නම් ප්‍රකාශයට පත් කිරීම, සහ ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීම යනාදිය) සුවිශේෂ වැදගත්කමක් දරන අතර ඒ සඳහා නිසි අවධානය යොමු නොවුනහොත් අපගේ සැලකිල්ලට ලක්ව ඇති මැතිවරණ ක්‍රමයෙන් අත්විය හැකි වාසි හෝ වෙනත් ලාභ යනාදිය අහිමි වීමට ඉඩ ඇත.

මැතිවරණ ක්‍රම සැලසුම් කිරීමේ දී මැතිවරණ නීතිරීති කෙරෙහි ද විවිධ බලපෑම් එල්ල වේ. දිස්ත්‍රික් මායිම් නිර්ණය කිරීම, ඡන්ද දායකයින් ලියාපදිංචි කරනු ලබන්නේ කෙසේ ද?, ඡන්ද පත්‍රිකාවේ ආකෘතිය කුමක් ද, ඡන්ද ගණන් කරුනු ලබන්නේ කෙසේ ද සහ මැතිවරණ ක්‍රියාවලියට සම්බන්ධ අනෙකුත් විවිධ කරුණු ඉන් සමහරකි. සෑම ඡන්ද දායකයකු විසින් ම හරියට ම තම එකම ඡන්දය ලබාදීමෙන් සහ සෑම පක්ෂයක් සඳහා හරියට ම එකම ඡන්ද සංඛ්‍යාවක් ලැබීමෙන් පසුව වුව ද, තෝරා ගනු ලැබූ මැතිවරණ ක්‍රමය අනුව මැතිවරණයේ ප්‍රතිඵල බෙහෝ සෙයින් වෙනස් වනු ඇත. එනම්, එක් ක්‍රමයක් අනුගමනය කිරීමෙන් සභාග රජයකට හෝ සුළුතර රජයකට මගපෑදෙන අතර, තවත් ක්‍රමයක් යටතේ තනි පක්ෂයකට බහුතර බලයක් භුක්තිවිඳීමට හැකිවනු ඇත.

## මැතිවරණ ක්‍රම සහ පක්ෂ ක්‍රම

සමහර මැතිවරණ ක්‍රම දේශපාලන පක්ෂ දිරිගන්වනවා පමණක් නොව, ඇතැම් අවස්ථාවන්හිදී ඒවා ක්‍රියාවට නැංවීම සඳහා සෘජුව ම දායක වෙති. තවත් සමහර මැතිවරණ ක්‍රම කේවල අපේක්ෂකයින් පමණක් පිළිගනිති. විශේෂයෙන්, ව්‍යවස්ථාදායකය තුළ නියෝජනය වන දේශපාලන පක්ෂ සංඛ්‍යාව සහ ඒවායේ පුළුල් සංයුතිය ඇතුලු වර්ධනය වෙමින් පවතින යම් පක්ෂ ක්‍රමයක් වේ ද ඒ සඳහා මැතිවරණ ක්‍රමයෙන් දැඩි බලපෑමක් සිදු වේ. එසේම දේශපාලන පක්ෂවල අභ්‍යන්තර සමගිය හා විනය සම්බන්ධයෙන් ද මැතිවරණ ක්‍රමයෙන් බලපෑම් සිදු වේ: පක්ෂ අභ්‍යන්තරයේ විවිධ කණ්ඩායම් අතර නිරන්තර ආරවුල් සහ ගැටුම් පවතින අවස්ථාවන්හි ඇතැම් මැතිවරණ ක්‍රම වෙතින් කට්ටිවාදය සඳහා ආධාර හා අනුබල ලැබේ. මේ අතර අභ්‍යන්තරයෙන් පැන නගින විරුද්ධ මතවාදවලට ඉඩනොදී පක්ෂය තුළ ඒකමතිකභාවය දිරිමත් කරවන මැතිවරණ ක්‍රම ද තිබේ. දේශපාලන පක්ෂ විසින් ස්වකීය ප්‍රචාරක කටයුතු පවත්වාගෙන යනු ලබන ආකාරය සහ දේශපාලන කෙෂත්‍රයේ විශිෂ්ට පුද්ගලයින්ගේ චර්යාව කෙරෙහි බලපෑම් සිදු කරමින් පුළුල් දේශපාලන පරාසයක් නිර්මාණය කිරීමට ද මැතිවරණ

ක්‍රමවලින් අනුබල ලැබේ. තවද, පක්ෂ අතර සංධාන ගොඩ නැගීමට රුකුල් දීම හෝ අධෛර්යමත් කිරීමද සිදුකළ හැකි ය. එසේම දේශපාලන පක්ෂ හා කණ්ඩායම්වලට වඩා පුළුල් පදනමක් මත ක්‍රියා කිරීමට සහ අනෙකුත් පක්ෂ හෝ කණ්ඩායම්වලට උපකාරී වන සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට හෝ පටු ජාතිකවාදී හෝ ඥාති සබඳතාවන් මත පදනම් වීමට ද මැතිවරණ ක්‍රමවලට හැකියාව තිබේ. නව ආයතනික ව්‍යුහයක් හෝ මැතිවරණ නීතියක් සම්පාදනය කිරීමේ දී හැකිතාක් දුරට පරිග්‍රාහීවීම මගින් මැතිවරණ පහසු කිරීමේ අපේක්ෂා ඇතිවුත් පුද්ගලවාදී සහ වාර්ගිකත්වය පදනම් වූ දේශපාලන පක්ෂ ක්‍රමය කැබලිවලට බිඳීයාමේ අවදානමක් පවතී.

ඒ නිසා ව්‍යවස්ථාදායකය නියෝජනය කිරීම සඳහා සැලසුම් කිරීමේ දී අවශ්‍යවනු ඇත.

විවිධාකාරයේ පක්ෂ රැසක් බිහිවීම ආඥාදායකත්වයෙන් නිදහස ලත් රටවල මැතිවරණවල දී පහසුවෙන් දකිත හැකි ලක්ෂණයකි. එසේම අවශ්‍ය ජනතා සහයෝගයක් නොමැතිව ඉදිරියට යා නොහැකිව හුදකලා වූ දේශපාලන පක්ෂ ස්වේච්ඡාවෙන් ම දේශපාලන රංගපීඨයෙන් ඉවත්වීමේ අවස්ථා ද ඇත.

සමාජය තුළ පවත්නා නොසන්සුන්කාරී තත්ත්වය උත්සන්න කිරීමට හෝ එහි බරපතලකම අවම කිරීමට විවිධ මැතිවරණ ක්‍රමවලට හැකියාව ඇත.....

ඊළඟ මැතිවරණයේ දී තමන්ට ජයග්‍රහණය කිරීමේ ඉඩ ප්‍රස්ථා ඇතැයි සිතීමට විරුද්ධ පක්ෂයට පවත්නා දේශපාලන රාමුව තුළ ඉඩ නොලැබෙන්නේ නම් හා පවත්නා මැතිවරණ ක්‍රමය සාධාරණ නොවන බවට ඒත්තු යන්නේ නම් පරාජයට පත් වූ පිරිස් ප්‍රධාන ප්‍රවාහයෙන් පිට පැන ප්‍රජාතන්ත්‍රීය නොවන ප්‍රචණ්ඩකාරී මාවතකට පිවිසීමට පෙළඹෙනු ඇත.

## මැතිවරණ ක්‍රම සහ අර්බුද කළමනාකරණය

සමාජය තුළ පවත්නා නොසන්සුන්කාරීත්වය උත්සන්න කිරීමට හෝ එහි බරපතලකම අවම කිරීමට විවිධ මැතිවරණ ක්‍රමවලට හැකියාව ඇත. එක් අවස්ථාවක සුළු ජාතික කණ්ඩායම්වල නියෝජනය වැදගත් බව අවධාරණය කරන මැතිවරණ ක්‍රම සහ එයට ඉඳුරාම වෙනස් අයුරින් ප්‍රබල තනි පක්ෂ රජයකට අනුබල සපයන මැතිවරණ ක්‍රම අතර නිරන්තරයෙන් නොසන්සුන්කාරී තත්ත්වයක් හට ගැනේ.

තවත් අවස්ථාවක ඊළඟ මැතිවරණයේ දී තමන්ට ජයග්‍රහණය කිරීමේ ඉඩප්‍රස්ථා ඇතැයි සිතීමට විරුද්ධ පක්ෂයට පවත්නා දේශපාලන රාමුව තුළ ඉඩ නොලැබෙන්නේ නම් හා පවත්නා මැතිවරණ ක්‍රමය සාධාරණ නොවන බවට ඒත්තු යන්නේ නම් පරාජයට පත්වූ පිරිස් ප්‍රධාන ප්‍රවාහයෙන් පිටපැන ප්‍රජාතන්ත්‍රීය නොවන ප්‍රචණ්ඩකාරී මාවතක් කරා පිවිසීමට පෙළඹෙනු ඇත.

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාර්යය පහසු කිරීම හෝ සංකීර්ණ බවට පත් කිරීම තෝරාගත් මැතිවරණ ක්‍රමය මත බොහෝ දුරට රඳා පවතින හෙයින්, සුළුජන කොටස්වලට හා වරප්‍රසාද නොලත් කණ්ඩායම්වලට බලපෑම් සිදුවීම නොවැළැක්විය හැකි ය.

## මැතිවරණ ක්‍රම සැලසුම් කිරීමේ ප්‍රමිතීන්

මැතිවරණ ක්‍රමයක් සැලසුම් කිරීමේ දී අපගේ අරමුණු, අප විසින් බැහැර කළ යුතු දෑ සහ පුළුල් වශයෙන් ගත් කල අපගේ ව්‍යවස්ථාදායක සහ විධායක රජය කුමන මුහුණුවරක් ගත යුතු ද යන්න කැටි කොට පෙන්නුම් කරනු ලබන ප්‍රමිතීන් කීපයක් උපයෝගී කරගැනීම බෙහෙවින් උචිත ය. ආයතනික ව්‍යුහයන් සැලසුම් කිරීමේ දී ස්වභාවයෙන් ම විවිධ තරගකාරී අභිලාෂයන් සහ අරමුණු යම්තාක් දුරට සමායෝජනය කළ යුතුව තිබේ.

ස්වභාවයෙන් ම එවැනි ව්‍යායාමයක දී විවිධ ගැටලු රාශියකට මුහුණ පෑමට සිදුවෙනු ඇත. නිදර්ශනයක් වශයෙන් කෙනෙකු ස්වාධීන අපේක්ෂකයින් තෝරා පත් කිරීම සඳහා අවස්ථාව ලබාදිය යුතු යයි පවසන අතර ම ශක්තිමත් දේශපාලන පක්ෂ පිහිටුවීම අවධාරණය කරනු ඇත. අපේක්ෂකයින් මෙන් ම දේශපාලන පක්ෂ තෝරා ගැනීම සඳහා ද ඡන්දදායකයින්ට පුළුල් ඉඩකඩක් ලබාදීමේ ක්‍රමයක් හඳුන්වා දීමේ දී ඡන්ද පත්‍රිකාවේ ස්වරූපය සංකීර්ණ වනු ඇත. එය අඩු අධ්‍යාපනයක් සහිත ඡන්ද දායකයින්ට මහත් ගැටලුවක් වනු නො අනුමාන ය. මැතිවරණ ක්‍රමයක් තෝරා ගැනීම හෝ සංශෝධනය කිරීම යනු ඉතාමත් වැදගත් ප්‍රමිතීන් ප්‍රමුඛත්වයක් මත පිහිටුවා ඉන්පසු කුමන මැතිවරණ ක්‍රමයක් හෝ ඒවායේ එකතුවක් බව අරමුණු සාක්ෂාත් කරලීමේලා උපරිම වශයෙන් දායකවන්නේ ද යන්න තක්සේරු කිරීමයි. මතු දැක්වෙන ප්‍රමිතීන් ඇතැම් අවස්ථාවන්හි එකිනෙක හා ඝට්ටනය වන අතර ඒවා අනුපිළිවෙළකට සකස් කිරීම වනාහි මැතිවරණ ක්‍රියාවලියේ ඉතාමත් ම අභියෝගාත්මක කාර්යය වනු ඇත.

### නියෝජනය සැලසීම

නියෝජනය අවම වශයෙන් කොටස් හතරකට බෙදා වෙන් කළ හැකි ය. ප්‍රථමයෙන් සෑම කලාපයක් හෝ ප්‍රධාන නගරයක් හෝ සුළු නගරයක් හෝ වේවා, පාළාතක් හෝ මැතිවරණ කොට්ඨාශයක් හෝ වේවා, රටේ භූමියෙන් යම් කිසි ප්‍රදේශයක් නියෝජනය කරමින් ව්‍යවස්ථාදායකයට තේරී පත් වූ මහජන නියෝජිතයින් අවසානයේ දී එම ප්‍රදේශයට වගකිව යුතුව ඇත.

දෙවනුව, සමාජය තුළ පවත්නා දේශපාලන මතවාද, විවිධ දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම්වල නියෝජිතයින් හෝ ඒ දෙකේම පොදු නියෝජිතයින් හරහා ව්‍යවස්ථාදායකයේ දී නියෝජනය වේ.

තෙවනුව දේශපාලන පක්ෂවලට මතවාදී පදනමක් නොමැති වුවද, රට තුළ පවත්නා පක්ෂ - දේශපාලන සංයුතිය ව්‍යවස්ථාදායකය තුළ නියෝජනය විය හැකි ය. ඡන්ද දායකයින්ගේ අධික ඡන්දය ලබාගත් දේශපාලන පක්ෂයකට ව්‍යවස්ථාදායකයේ එකම ආසනයක් හෝ දිනාගැනීමට නොහැකි වන්නේ නම් එම මැතිවරණ ක්‍රමය ජනතා අභිලාෂයන් ප්‍රමාණවත් අයුරින් නියෝජනය කරන බව කිව නොහැකියි.

සතර වෙනුව, ''කැඩපත් නියෝජනය'' පිළිබඳ සංකල්පය අනුව ව්‍යවස්ථාදායකය යම් ප්‍රමාණයකට හෝ ''ජාතියේ කැඩපත'' විය යුතුයි. සමස්තයක් වශයෙන් ජනතාව අංග සම්පූර්ණ නියෝජනය වන බව ඒ තුළින් ප්‍රදර්ශනය වීම වැදගත්. ප්‍රමාණවත් ' කැඩපත් නියෝජනයක්' තුළ ගැහැනු, පිරිමි, තරුණ සහ මහලු දුප්පත් සහ පොහොසත් යනාදී සමාජයේ සියලු කොටස් මෙන් ම විවිධ ආගමික කණ්ඩායම්, විවිධ භාෂා කතා කරන කණ්ඩායම් සහ වාර්ගික ජන කොටස් ද ඇතුළත් විය යුතුයි.

**මැතිවරණයක් ජනතාවට වැදගත් වුවත්, ඡන්දය දීම දුෂ්කර කාර්යයක් වී ඇත්නම් හෝ ඔවුන්ගේ ඡන්දය රටේ පාලනයේ වෙනසක් සිදු කිරීමට අපොහොසත් වී සිටිනම් ඉන් ජනතාවට සිදුවන සෙතක් නොමැත.**

## මැතිවරණ අර්ථවත් කිරීම සහ ජනතාවට සමීප කිරීම

මැතිවරණයක් ජනතාවට වැදගත් වුවත්, ඡන්දය දීම දුෂ්කර කාර්යයක් වී ඇත්නම් හෝ ඔවුන්ගේ ඡන්දය රටේ පාලනයේ වෙනසක් සිදු කිරීමට අපොහොසත් වී ඇත්නම් ඉන් ජනතාවට සිදුවන සෙතක් නොමැත.

ඡන්ද පත්‍රිකාවේ සංකීර්ණ ස්වරූපය, ඡන්ද දායකයිනට ඡන්ද මධ්‍යස්ථානයට යාමේ පහසුව, ඡන්ද දායකයින්ගේ නාම ලේඛනය කෙතරම් දුරට අංග සම්පූර්ණ ද සහ ස්වකීය ඡන්ද පත්‍රිකාවේ රහස්‍යභාවය සම්බන්ධයෙන් ඡන්ද දායකයා කොතරම් දුරට සෑහීමට පත්වන්නේ ද යන කරුණු මත ඡන්දය ප්‍රකාශ කිරීම රඳා පවතියි. ජාතික මට්ටමින් හෝ දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වෙන මැතිවරණයක අවසාන ප්‍රතිඵලය මගින් රජයේ ඉදිරි ගමන සැලකිය යුතු වෙනසකට භාජනය වීමට ඉඩ ඇති විටෙක මැතිවරණය සඳහා වූ ජනතා සහභාගිත්වය ඉහළ යාමට ඉඩ තිබේ.

''ඇසගහගෙන'' සිටින අපේක්ෂකයාට ඔබේ දිස්ත්‍රික්කයෙන් ජයග්‍රහණය කිරීමට ඉඩක් නොමැති බව ඔබට හැඟේ නම්, ඡන්දය දීමට ඔබ දිරිමත් වන්නේ ද? ඇතැම් මැතිවරණ ක්‍රම යටතේ ''අපතේ ගිය ඡන්ද' (උදාඃ කුමන හෝ අපේක්ෂකයකු තෝරාපත් කිරීමේ දී සැලකිල්ලට නොගැනෙන වලංගු ඡන්ද) ප්‍රමාණය රටේ සමස්ත ඡන්ද සංඛ්‍යාවෙන් සැලකිය යුතු කොටසක් විය හැකියි.

## මැතිවරණ ක්‍රම සතු කාර්යභාරය

මැතිවරණ ක්‍රම රටේ පාලනය සඳහා අවශ්‍ය ආයතන පිහිටුවීම පිණිස උපයෝගි කරගත හැකිවා පමණක් නොව සමාජය තුළ පැන නගින විවිධ අර්බුද කළමනාකරණය සඳහා මෙවලමක් වශයෙන් ද ප්‍රයෝජනයට ගත හැකි ය.

සමහර අවස්ථාවල ඇතැම් විශේෂ තත්ත්වයන් යටතේ දේශපාලන පක්ෂවලට ස්වකීය ''ඡන්ද බලමුලුවෙන්'' එපිට ප්‍රතිවිරුද්ධ කඳවුරේ සහාය පැතීම සඳහා ද මැතිවරණ ක්‍රම වෙතින් රුකුල් සැපයේ. යම් දේශපාලන පක්ෂයක් ප්‍රධාන වශයෙන් කළු ජාතිකයින්ගේ ඡන්දය ලබාගැනීමට සමත්ව සිටිය දී වුවද, විශේෂ මැතිවරණ ක්‍රමයක් විසින් සුදු ජාතිකයින්ගේ හෝ වෙනත් කණ්ඩායමක ඡන්දය ලබාගැනීම සඳහා එම පක්ෂයට පෙළඹවීම්

**ශක්තිමත් සහ කාර්යක්ෂම රජයක් සඳහා වූ අපේක්ෂා මැතිවරණ ක්‍රමයකින් පමණක් සපුරාලීමට නොහැකිමුත් කිසියම් මැතිවරණ ක්‍රමයකින් ඇතිවන ප්‍රතිඵල රට තුළ ස්ථාවරත්වය තහවුරු කිරීමේලා විවිධ අයුරින් දායක වනු ඇත.**

**මැතිවරණ ක්‍රමය හැකිතාක් දුරට සියලු පක්‍ෂ හා අපේක්‍ෂකයන් දෙසට පක්‍ෂග්‍රාහී බවින් තොරව සමානව ක්‍රියාකළ යුතු ය. එය එළිපිට ම කුමන හෝ දේශපාලන කණ්ඩායමකට අඩු හෝ වැඩි සැලකිලි දැක්වීමෙන් වැළකී සිටිය යුතු ය.**

**ප්‍රජාතන්ත්‍රවාදී රටක මැතිවරණ දේශපාලනය සැමට සමාන අවස්ථා නොසලසන බවට පැතිරී ඇති ආකල්ප ජාතික දේශපාලන දේහයේ දුබලභාවය සංකේතවත් වන අතර රටේ අස්ථාවරභාවය ළඟ ළඟම සිදුවන බවට කෙරෙන අනතුරු ඇඟවීමක් සේ සැලකිය හැකි ය.**

කරනු ඇත. ඒ අනුව දේශපාලන පක්ෂ බිඳී වෙන් වී යාම වෙනුවට පරිග්‍රාහී ස්වරූපයෙන් වඩාත් සවිබල ගැන්වෙනු ඇත. දිරිගැන්වීම් සැපයෙන එබඳු මැතිවරණ ක්‍රම මගින් දේශපාලන පක්ෂ පටු වාර්ගික, කලාපීය, භාෂාවක යන මතවාදී හේතු උඩ කැඩී වෙන් වී යාමේ ප්‍රවනතාවන් අවම කරනු ඇත.

කාසියේ අනෙක් පැත්ත සලකා බලමු.

ස්වකීය කණ්ඩායමෙන් පිට සාම්ප්‍රදායික වශයෙන් වෙනත් කණ්ඩායමක් නියෝජනය කර ඇති පක්ෂවලට ඡන්දය දීම ගැන සිතා බැලීම සඳහා ඡන්ද දායකයින් පෙළඹවීමට මැතිවරණ ක්‍රමවලට හැකියාව තිබේ.

ඡන්දය ප්‍රකාශ කිරීමේ එබඳු චර්යාවන් ප්‍රජාවේ දියුණුවට මහත් පිටිවහලෙකි. ඡන්ද දායකයෙකුට එකකට වඩා වැඩියෙන් ඡන්ද හිමිකර දෙන ක්‍රම හෝ සිය මනාපය පරිදි කතිරය ගැසීම දිරිමත් කරනු ලබන මැතිවරණ ක්‍රමවලට ඡන්ද දායකයින්ට සීමා බන්ධනවලින් තොරව නිදහසේ ස්වකීය ඡන්දය පාවිච්චි කිරීමේ අවස්ථාව ලබාදීමේ හැකියාව ඇත.

## ශක්තිමත් හා කාර්යක්ෂම රජයක් සඳහා පහසුකම් සැලසීම

ශක්තිමත් සහ කාර්යක්ෂම රජයක් සඳහා වූ අපේක්ෂා මැතිවරණ ක්‍රමයකින් පමණක් සපුරාලීමට නොහැකිමුත් කිසියම් මැතිවරණ ක්‍රමයකින් ඇතිවන ප්‍රතිඵල රට තුළ ස්ථාවරත්වය තහවුරු කිරීමේලා විවිධ අයුරින් දායක වනු ඇත.

මේ අතර මැතිවරණ ක්‍රමය සාධාරණ බවට ඡන්ද දායකයින් කල්පනා කරන්නේ ද, රජයට කාර්යක්ෂම අයුරින් අවශ්‍ය නීතිරීති පැනවීම මගින් රට පාලනය කළ හැකි ද සහ මැතිවරණ ක්‍රමය යටතේ යම් පක්ෂ හෝ උනන්දුවක් දක්වන කණ්ඩායම්වලට කෙනහිලිකම් සිදුවන්නේ ද යන මේවා වැදගත් ප්‍රශ්න බවට පත් වී තිබේ.

පිළිවෙළින් ව්‍යවස්ථා දායකය තුළින් ලබාගත හැකි බහුතරයේ සහයෝගය සහ මැතිවරණ ක්‍රමය යන කරුණු මත, බලයේ සිටින රජයට කාර්යක්ෂම අයුරින් ව්‍යවස්ථා පැනවිය හැකිද යන්න අඩ වශයෙන් රඳා පවතී. ලෝක සම්මත නීතියක් නොවූවද, අත්දැකීම් මත පදනම් වූ ප්‍රායෝගික රීතියක් වශයෙන් බහුත්ව /බහුතර මැතිවරණ ක්‍රමවලට එක් දේශපාලන පක්ෂයක් ලවා මුළු ඒකාබද්ධ විරුද්ධ පක්ෂයම පරදවාලීමට සමත් ව්‍යවස්ථාදායකයක් පිහිටු විය හැකි ය. මේ අතර සමානුපාතික මැතිවරණ ක්‍රමය මගින් සභාය ආණ්ඩු පිහිටුවීම පහසු කළ හැකි ය.

මැතිවරණ ක්‍රමය හැකිතාක් දුරට සියලු පක්ෂ හා අපේක්ෂකයින් දෙසට පක්ෂග්‍රාහී බවින් තොරව සමානව ක්‍රියා කළ යුතු ය. එය එළිපිට ම කුමන හෝ දේශපාලන කණ්ඩායමකට අඩු හෝ වැඩි සැලකිලි දැක්වීමෙන් වැළකී සිටිය යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදී රටක මැතිවරණ දේශපාලනය සැමට සමාන අවස්ථා නොසලකන බවට පැතිරී ඇති ආකල්ප ජාතික දේශපාන දේහයේ

දුබලතාව සංකේතවත් වන අතර රටේ අස්ථාවරභාවය ළඟ ළඟම සිදුවන බවට කෙරෙන අනතුරු ඇඟවීමක් සේ සැලකිය හැකි ය.

## රජය මත වගකීම් භාරය පැවරීම

වගකීම්භාරය දැරීම නියෝජිත රජයක මූලිකාංගයකි. එය නොමැති තැන දීර්ඝ කාලීන අස්ථාවරභාවයට මග පෑදේ. එක්කෝ බලයේ සිටින පක්ෂ සභාගය වෙනස් කරමින් හෝ ජනතා අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වූ පාලක පක්ෂයක් බලයෙන් පහකරමින් හෝ රජයේ ක්‍රියාකලාපය වෙනසකට ලක් කිරීම සඳහා බලපෑම් කිරීමට ඡන්ද දායකයින්ට හැකිවිය යුතුයි. මෙම අරමුණ සාක්ෂාත් කිරීමේලා උචිත ආකාරයෙන් සැලසුම් කරන ලද මැතිවරණ ක්‍රමවලට හැකියාව ඇත.

## මහජන නියෝජිතයින් වෙත වගකීම් භාරය පැවරීම

ඡන්දයෙන් තේරීපත් වූ මහජන නියෝජිතයින් මැතිවරණය තුළ දී ජනතාවට දුන් පොරොන්දු කඩකර තිබේ ද හෝ රාජකාරියේ දී අකාර්යක්ෂම භාවය හෝ අලසකම ප්‍රදර්ශනය කරනු ලබන්නේ ද යන්න මැනවින් පරීක්ෂා කර බලා ඔවුන් පලවා හැරීමේ ඡන්ද දායකයින් සතු හැකියාව යනු පුද්ගල මට්ටමේ වගකීම් භාරය සපුරාලීමයි.

ඇතැම් මැතිවරණ ක්‍රම රටේ ප්‍රබල ජාතික පක්ෂයක් විසින් නම් කරන ලද අපේක්ෂකයින්ට වඩා ජනතාව අතර ජනප්‍රිය භාවයක් උසුලන අපේක්ෂකයින්ගේ කාර්යභාරය අවධාරණය කරති. උදාසීන හා අකාර්යක්ෂම මහජන නියෝජිතයින් පලවා හැරීම සඳහා ඡන්ද දායකයින්ට බහුත්ව/බහුතර මැතිවරණ ක්‍රම සාම්ප්‍රදායික වශයෙන් මහත් පිටිවහලක් වී ඇති බව පෙනෙතත්, අපේක්ෂකයාට වඩා දේශපාලන පක්ෂවලට ප්‍රමුඛස්ථානය ලැබීමේ දී එය අකර්මන්‍ය වේ. ඒ සමග ම සාමනුපාතික ඡන්ද ක්‍රමය යටතේ ''විවෘත ලයිස්තු ක්‍රමය'' අනුසාරයෙන් ඡන්ද පත්‍රිකාව මත ස්වකීය මනාපය ප්‍රකාශ කිරීමට ඡන්දදායකයින්ට හැකියාව තිබේ.

## දේශපාලන පක්ෂ දිරි ගැන්වීම

කාලයක් පුරා ප්‍රජාතන්ත්‍රවාදය මැනවින් ස්ථාපිත වූ රටවල් මෙන්ම තවමත් ළදරු වියේ පසුවන ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ලත් අත්දැකීම් අනුව ප්‍රජාතන්ත්‍රවාදය ගැඹුරින් මුල් බැස ගැනීම සඳහා දේශපාලන පක්ෂ ශක්තිමත් පදනමක් මත පවත්වා ගෙන යාම අවශ්‍ය බැවින් ඒ සඳහා මැතිවරණ ක්‍රමය ප්‍රබල රැකුලක් වනවා මිස දේශපාලන පක්ෂ කැබලිවලට බිඳීයාමට ඉඩ නොදිය යුතුයි. සුළු හෝ ආරම්භක මට්ටමේ ජනතා සහයෝගයක් භුක්තිවිඳින පක්ෂ දේශපාලන රංග පීඨයෙන් ඉවත් කිරීමේ අරමුණින් මැතිවරණ ක්‍රම සැලසුම් කිරීමේ හැකියාව ද ඇත. දේශපාලන නායකයින්ගේ අනාගතය

**ප්‍රබල විරුද්ධ පක්‍ෂයක අවශ්‍යතාව තහවුරු කිරීමට මැතිවරණ ක්‍රමය සමත් විය යුතු ය.**

රඳා පවතින දේශපාලන පක්ෂ නගා සිටුවීම හෝ අකර්මන්‍ය කිරීම ඉලක්ක කරගනිමින් මැතිවරණ ක්‍රම සැලසුම් කිරීමේ හැකියාව ඇත.

## ව්‍යවස්ථාදායකය තුළ විරුද්ධ පක්ෂය ශක්තිමත් කිරීම

කාර්යක්ෂම රාජ්‍ය පාලනයක් සඳහා බලයේ සිටින පාලක පක්ෂය පමණක් නොව විරුද්ධ පක්ෂය සතුව ද වගකිව යුතු කාර්යභාරයක් පැවරී තිබේ. නිරන්තර අධීක්ෂණය ඔවුන් සතු ප්‍රබල වගකීමකි. රජයේ නීති සම්පාදන කාර්යයන් විවේචනාත්මකව විමසා බැලීම විධායකයේ කාර්ය සාධනය ප්‍රශ්න කිරීම, සුළුජන කොටස්වල අයිතිවාසිකම් සුරැකීම සහ ස්වකීය ඡන්ද දායකයින් වැඩදායී අයුරින් නියෝජනය කිරීම යනාදී ජනතාවට වැදගත් වන කරුණු සපුරාලීම සඳහා ප්‍රබල විරුද්ධ පක්ෂයක අවශ්‍යතාව තහවුරු කිරීමට මැතිවරණ ක්‍රමය සමත් විය යුතුයි. විරුද්ධ පක්ෂයට ද තම කාර්යභාරය සාර්ථකව ඉටු කිරීම සඳහා ව්‍යවස්ථාදායකය තුළ ප්‍රමාණවත් ශක්තියක් තිබිය යුතු ය. පාර්ලිමේන්තු ක්‍රමය යටතේ විරුද්ධ පක්ෂය, බලයේ සිටින රජයට හොඳ විකල්පයකි. මැතිවරණ ක්‍රමය හැරුන විට වෙනත් වැදගත් සාධක රැසක් මත විරුද්ධ පක්ෂයේ ශක්තිය රඳා පවතින අතර, යම් හෙයකින් එම මැතිවරණ ක්‍රමය විසින් ම විරුද්ධ පක්ෂය බෙලහීන වන තැනට කටයුතු සිදු කරන්නේ නම් ප්‍රජාතන්ත්‍රවාදී පාලනතන්ත්‍රය නිතැතින් ම අකර්මන්‍යය වන බව නොකිවමනා ය.

විරුද්ධ මතවාද හා අදහස් මෙන්ම විරුද්ධ පක්ෂය නියෝජනය කරනු ලබන ඡන්ද දායකයින්ගේ අවශ්‍යතා හා අභිලාෂයන් වෙත පාලකයින්ගේ අවධානය ලැබීම වළක්වමින් හා මැතිවරණ සහ රජය යන දෙකම හුදු 'ශුන්‍ය-ඓක්‍ය' තරග වශයෙන් සලකමින් 'ජයග්‍රාහකයා ජගතාය' යන ආකල්පය වර්ධනය වීමට ඉඩ නොදීම මැතිවරණ ක්‍රමය සතු එක් ප්‍රධාන වගකීමකි.

ජනාධිපති ක්‍රමයක් තුළ, සැලකිය යුතු ප්‍රමාණයකට ව්‍යවස්ථාදායකයේ විශ්වසනීය සහයෝගය ජනාධිපතිවරයාට අවශ්‍ය වේ. එසේම රජයේ නීති සම්පාදන වැඩ පිළිවෙළට විරුද්ධ වෙමින් ඒවා තියුණු විමසුමකට ලක් කරන අනෙකුත් පිරිස්වල කාර්යභාරය ද එකසේ ම වැදගත් ය.

ව්‍යවස්ථාදායකය සහ විධායකය අතර බලතල බෙදා වෙන් කිරීම මගින් විරුද්ධ පක්ෂයේ නියෝජිතයින් ඇතුලු සියලු ව්‍යවස්ථාදායකයින්ට විධායක අධීක්ෂණය පැවරේ. මේ නිසා දේශපාලන පක්ෂ සහ අපේක්ෂයින්ට සමගාමීව පක්ෂ සහ ඒවායේ තේරීපත් වූ නියොජිතයින්ගේ සාපේක්ෂ වැදගත්කම ගැන උනන්දුවක් දක්වන මැතිවරණ ක්‍රමයේ මූලිකාංග ගැන සැලකිලිමත් වීම වැදගත් ය.

## මැතිවරණ ක්‍රියාවලිය තිරසාර අයුරින් පවත්වාගෙන යාම

මැතිවරණ ක්‍රමයක් තෝරා ගැනීමේ දී ඒ සඳහා වැයවන වියදම් සහ පරිපාලනමය අවශ්‍යතා බෙහෙවින් වැදගත් වේ.

රටක් තුළ දිගින් දිගට සාර්ථක අයුරින් දේශපාලන ව්‍යුහයක් පවත්වාගෙන යාම සඳහා එරට සතු සම්පත්, එනම් මැතිවරණකටයුතු පරිපාලනය කිරීමේ කුසලතා සහිත නිලධාරීන් සහ ජාතික අයවැයෙන් සපුරාලිය යුතු මූල්‍ය සම්පත් ඉතා වැදගත් ය.

කෙටි කාලීන වශයෙන් වැදගත් සරල ප්‍රවේශයක් දීර්ඝකාලීනව සියලු අවස්ථාවන්හිදී ලාභදායි නොවනු ඇත. අරම්භයේ දී යම් මැතිවරණ ක්‍රමයක් පරිපාලනය කිරීමේ දී සුළු වශයෙන් වැඩි වියදමක් දැරීමට සිදුවන අතර එය සාමාන්‍ය ඡන්ද දායකයාට සංකීර්ණ වන්නට ද පුළුවන. එහෙත් එබඳු ක්‍රමයක් දීර්ඝකාලීන වශයෙන් රටේ ස්ථාවරභාවය ඇති කිරීමේ හා ප්‍රජාතන්ත්‍රීය ගමන් මගේ දිසාව නිර්නය කිරීමේලා වැදගත් වනු ඇත.

## ජාත්‍යන්තර ප්‍රමිතීන් සැලකිල්ලට ගැනීම

වර්තමානයේ මැතිවරණ ක්‍රම සැලසුම් කිරීම ජාත්‍යන්තර ප්‍රඥප්තීන්, ගිවිසුම් සහ දේශපාලන වශයෙන් වැදගත් නෛතික ගිවිසුම් රැසක් සහ දේශපාලන විෂයයන්ට අදාළ අනෙකුත් විවිධ නෛතික සම්මුතීන් ක්‍රියාත්මකව පවතින සන්දර්භයක් තුළ සිදු වේ. මැතිවරණ පැවැත්වීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිති මාලාවක් නොමැති මුත් සර්වජන වැඩිහිටි ඡන්ද බලය තහවුරු කරනු ලබන නිදහස් හා සාධාරණ මැතිවරණ, ඡන්ද පත්‍රිකාවේ රහස්‍යභාවය සහ කිසිදු බලපෑම්වලට යටත් නොවීමේ නිදහස සහ 'එක් පුද්ගලයෙකුට එක ඡන්දයක් පමණයි' යන මූලධර්ම ඉහත කී ප්‍රමිතීන්ට ඇතුළත් බවට සාමූහිකවශයෙන් එකඟතාවය පළ වී තිබේ.

සියලු ම පුරවැසියන් සාධාරණ අයුරින් නියෝජනය වීම, ගැහැනු සහ පිරිමි අතර සමානාත්මතාව, සුළුජන කොටස් සතු අයිතිවාසිකම්, ආබාධිත ජනයාට විශේෂ සැලකිලි දැක්වීම මැතිවරණ ක්‍රමවලට සෘජුව බලපාන කරුණු විශේෂ පිළිගැනීමකට ලක් වී ඇත. මානව වර්ගයා සඳහා ඒවායේ ඇති වැදගත්කම සැලකිල්ලට ගනිමින් ඒ සඳහා 1948 ජගත් මානව හිමිකම් ප්‍රකාශණය සහ 1966 ජාත්‍යන්තර සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ ප්‍රඥප්තිය වැනි නෛතික ලේඛන මගින් විධිමත් ආවරණය ලබා දී තිබේ.

## මැතිවරණ ක්‍රමය සැලසුම් කිරීමේ ක්‍රියාවලිය

මැතිවරණ ක්‍රමයක් සැලසුම් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙළ අවසානයේ දී එළි දක්වනු ලබන මැතිවරණ ක්‍රමය, පවත්නා දේශපාලන තත්ත්වයන් සම්බන්ධයෙන් එහි උචිතභාවය නිත්‍යානුකූල භාවය සහ ඒ සඳහා පොදු මහජනතාව ගෙන් ලැබෙන සහයෝගය කෙරෙහි ඉමහත් බලපෑමක් ඇති කරයි.

මැතිවරණ ක්‍රමයට අදාළ වැදගත් ප්‍රශ්න රාශියක් ඇත.

එනම් : ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිශෝධන සඳහා දේශපාලන හා නෛතික ව්‍යුහයට ඇතුළත් කර ඇති යාන්ත්‍රණ කවරේද?

**වර්තමානයේ මැතිවරණ ක්‍රම සැලසුම් කිරීම ජාත්‍යන්තර ප්‍රඥප්තීන්, ගිවිසුම් සහ දේශපාලන වශයෙන් වැදගත් නෛතික ගිවිසුම් රැසක් සහ දේශපාලන විෂයයන්ට අදාළ අනෙකුත් විවිධ නෛතික සම්මුතීන් ක්‍රියාත්මකව පවතින සන්දර්භයක් තුළ සිදුවන්නකි.**

**මැතිවරණ ක්‍රමයක් සැලසුම් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙළ අවසානයේ දී එළි දක්වනු ලබන මැතිවරණ ක්‍රමය, පවත්නා දේශපාලන තත්ත්වයන් සම්බන්ධයෙන් එහි උචිතභාවය නිත්‍යානුකූල භාවය සහ ඒ සඳහා පොදු මහජනතාව ගෙන් ලැබෙන සහයෝගය කෙරෙහි ඉමහත් බලපෑමක් ඇති කරයි.**

**කාලයාගේ ඇවෑමත් සමගම ඇතිවන නව දේශපාලන, ජනගහන හා ව්‍යවස්ථාදායක ප්‍රවණතාවන් සහ අවශ්‍යතාවන්ට ඔරොත්තු දෙන පරිදි මැතිවරණ ක්‍රම අනිවාර්යයෙන් ම හැඩගැසීම අවශ්‍ය වේ.**

යෝජිත නව හෝ ප්‍රතිශෝධිත ක්‍රමයක් නීත්‍යානුකූල බවට පිළිගැනීම සඳහා කුමන සාකච්ඡා සහ සංවාද ක්‍රියාවලියක් අවශ්‍ය වන්නේ ද?

යම් වෙනසක් සිදු කළ බවට තීරණය කිරීමෙන් පසු එය ක්‍රියාත්මක කරන්නේ කෙසේ ද?

## නෛතික යාන්ත්‍රණ, සංවාදය සහ ප්‍රතිසංස්කරණ හා සංශෝධන ක්‍රියාත්මක කිරීම

රටක පවත්නා ආණ්ඩු ක්‍රමය ක්‍රියාත්මක වන ආකාරය කෙරෙහි බලපාන මැතිවරණ ක්‍රම අතිශය වැදගත් ආයතන වන මුත් සාම්ප්‍රදායානුකූලව, රටේ උසස්ම නීතිය වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුළ ඒවා විධිමත් අයුරින් විධිවිධාන සාලසා නොමැත. එහෙත් මෑතක සිට එම තත්ත්වය වෙනස් වීමට පටන් ගෙන ඇත. සාමාන්‍ය නීති මෙන් නොව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක ගැබ්ව ඇති විධිවිධාන වෙනස් කිරීම පහසුවෙන් කළ නොහැකි ය. ඒ සඳහා ව්‍යවස්ථාදායකයේ විශේෂ වැඩි ඡන්ද සංඛ්‍යාවක්, ජාතික ජනමත විචාරණයක් හෝ වෙනත් ආකාරයේ විශේෂ යාන්ත්‍රණයක් අවශ්‍ය වේ. මෙබඳු යාන්ත්‍ර මගින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ආවාට ගියාට වෙනස් කිරීම වළකා තිබේ.

කෙසේ වුවද, මැතිවරණ ක්‍රමය පිළිබඳ විස්තර නිතොර පාහේ සාමාන්‍ය නීතිය තුළ අඩංගුව ඇති බැවින් ව්‍යවස්ථාදායකයේ සුළු වැඩි ඡන්දයකින් අවශ්‍ය වෙනස් කිරීම් සිදුකළ හැකි ය. මේ නිසා මහජන මතය සහ දේශපාලන වුවමනාවන් භාජනය වන වෙනස්වීම්වලට පහසුවෙන් ප්‍රතිචාර දැක්විය හැකි වේ. එසේ වුව ද, ව්‍යවස්ථාදායකයේ බහුතරයට හුදු දේශපාලන වාසි තකා තනි මතයට මැතිවරණ ක්‍රමයේ වෙනස්කම් සිදු කිරීමේ අවදානම ඇත. කාලයාගේ ඇවෑමත් සමග ම ඇතිවන නව දේශපාලන, ජනගහන හා ව්‍යවස්ථාදායක ප්‍රවනතාවන් සහ අවශ්‍යතාවන්ට ඔරොත්තු දෙන පරිදි මැතිවරණ ක්‍රම අනිවාර්යයෙන් ම හැඩ ගැසීම අවශ්‍ය වේ. එහෙත් ක්‍රියාත්මකව පවත්නා යම් මැතිවරණ ක්‍රමයක් වේ ද, ඉන් පල ප්‍රයෝජන ලබන පිරිස් ඒවායේ වෙනස්කම් සිදු කිරීම කෙරෙහි මනාපය නොදක්වති. අනාගතයේ විශාල දේශපාලන පරිවර්තනයකට තුඩු දෙන මූලික වෙනසකට වඩා සුළු වශයෙන් කෙරෙන වෙනස්කම්වලට බෙහෙවින් අවකාශ ඇති බැවින් මුල් අවස්ථාවේදී ම මැතිවරණ ක්‍රමය නිවරැදි මාවතකට යොමු කිරීම වටී.

කිසියම් විශේෂ මැතිවරණ ක්‍රමයකින් සමාජයට ඇතිවන බලපෑම පිළිබඳ වැටහීමක් ඇත්තේ සමාජයේ ඉහළ පැලැන්තියේ මෙන්ම සාමාන්‍ය ජනතාව අතර ඉතා සීමිත සංඛ්‍යාවකට පමණක් විය හැකි ය. මැතිවරණ ක්‍රමය ක්‍රියාත්මක වීම පෙනෙන ආකාරයට ප්‍රයෝගිකව ඉතා සුළු කරුණු මත රඳා පැවතිය හැකි බැවින් මේ තත්ත්වය වඩාත් උග්‍ර වී ඇත. අලුතින් සැලසුම් කරන ලද මැතිවරණ ක්‍රමයක් යටතේ අනුකාරක මැතිවරණවලට මහජනතාව සහභාගි කරවා ගැනීමේ වැඩ සටහන් මාධ්‍ය අවධානය ඇද ගැනීමට සමත් වනු ඇත. එමගින් ඡන්දදායකයින් නව මැතිවරණ ක්‍රමයකට හුරුවනු ඇත.

නව මැතිවරණ ක්‍රමයකින් ඡන්ද පත්‍රිකාව පිළිබඳව ඡන්ද දායකයාට ඇතිවිය හැකි ගැටලු හඳුනාගැනීමට ද එමගින් ඉඩකඩ සැලසේ.

මැතිවරණ ක්‍රමවල වෙනසක් ඇති කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වීමට නම් නව ක්‍රම ක්‍රියාත්මක වන ආකාරය ඡන්ද දායකයින්ට අවබෝධ කරවීමේ ප්‍රබල අධ්‍යාපන වැඩ සටහන් මෙන්ම ඡන්ද දායකයින්ගේ සිත් දිනාගැනීමට සමත් හා ක්‍රියාත්මක කිරීමට පහසු නීතිරීති ද අවශ්‍ය වේ.

ඡන්ද දායකයින්ට බෙහෙවින් පලදායි වන දැනුම ලබා දීම මෙන්ම මැතිවරණ පරිපාලනය පිළිබඳ පුහුණුව ලබා දීම ද කල්ගත වන කාර්යකි. නව ක්‍රමයක් යටතේ මැතිවරණයක් සංවිධානය කරනු ලැබීමේ දී මැතිවරණ කොමිසමකට ලැබෙන්නේ ඉතා සීමිත කාලයකි. ඒ නිසා හැකිතාක් ඉක්මනින්, හැකිතාක් විශාල වැඩ කොටසක් නිමා කිරීම මැතිවරණ කොමිසමක් විසින් අනුගමනය කළ යුතු බුද්ධිමත් ක්‍රියා මාර්ගයක් වනු ඇත.

විවිධ මැතිවරණ ක්‍රම රාශියක් ඇත. එහෙත් ඒවා ප්‍රධාන ක්‍රම දොළහකට... පෙළ ගැස්විය හැකියි.

මැතිවරණ ක්‍රම.... පුළුල් මැතිවරණ ක්‍රම වඩාත් පුළුල් වශයෙන් බහුත්ව / බහුතර ක්‍රම සමානුපාතික ක්‍රම සහ මිශ්‍ර ක්‍රම වශයෙන් ශීර්ෂ තුනක් යටතේ පෙළගැස්විය හැකියි.

## මැතිවරණ ක්‍රමයක් තෝරා ගැනීම

නව මැතිවරණ ක්‍රමයක් තුළ සාක්ෂාත් කරගත යුතු අමුණු සහ බැහැර කළ යුතු වැදගත් අත්තරායන් පිළිබඳ තීරණයකට එළඹීමෙන් පසු, එම අරමුණු සපුරාලීමට අවශ්‍ය මැතිවරණ ක්‍රම සැලසුම් කිරීම සඳහා උපයෝගී කරගත හැකි මෙවලම් රැසක් ඇති අතර මැතිවරණ ක්‍රම සහ වර්ග, දිස්ත්‍රික්කයෙන් ව්‍යවස්ථාදායකයට තෝරා පත් කරනු ලබන නියෝජිත සංඛ්‍යාව, දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයින් සතු කාර්ය භාරය, ඡන්ද පත්‍රිකාවේ ආකෘතිය, මැතිවරණ කොට්ඨාශ සීමා නිර්ණය කිරීමේ ක්‍රියාපටිපාටිය, මැතිවරණ කොට්ඨාශ ලියාපදිංචි කිරීමේ යාන්ත්‍රණය, මැතිවරණ පැවැත්වීමේ කාල වකවානු, එකවර මැතිවරණ පැවැත්වීම සහ අනෙකුත් විශේෂ විධිවිධාන ඉන් කීපයක් පමණි. මෙම මෙවලම් වෙනස් ආකාරයෙන්, වෙනස් පදනමක් මත ඒකාබද්ධව ක්‍රියා කරති.

කෙසේ වුවද, කවර සමාජයක් සඳහා හෝ තනි ''නිවැරදි විසඳුමක්'' හඳුන්වා දීම උගහට බව අවබෝධ කළ යුතුව ඇත.

විවිධ මැතිවරණ ක්‍රම රාශියක් ඇත. එහෙත් ඒවා ප්‍රධාන ක්‍රම දොළහකට සහ වඩාත් පුළුල් වශයෙන් බහුත්ව / බහුතර ක්‍රම, සමානුපාතික ක්‍රම සහ මිශ්‍ර ක්‍රම වශයෙන් ශීර්ෂ තුනක් යටතේ පෙළ ගැස්විය හැකියි. මේ සියලු ක්‍රම 2005 වසරේ මැයිවලදී ප්‍රසිද්ධියට පත් කරන ලද, ''මැතිවරණ ක්‍රම සැලසුම් කිරීම, නව ජාත්‍යන්තර අයි.ඩී.ඊ.ඒ. අත්පොත'' ග්‍රන්ථයේ ඉතා ගැඹුරින් විස්තර කර ඇත.

අනෙක් මැතිවරණ ක්‍රම අතුරින් පහක් පමණක් වඩා බහුල වශයෙන් ක්‍රියාත්මක වෙමින් පවති. එනම්,

1. කේවල ඡන්ද කොට්ඨාශ ක්‍රමය සහ ද්විත්ව වට ක්‍රමය. මෙය බහුත්ව /බහුතර ක්‍රම පවුලේ සාමාජිකයෝ ය.

**බහුත්ව / බහුතර ක්‍රම පිළිබඳ මූලධර්මය සරල එකකි. ඡන්දය ප්‍රකාශ කර, ඡන්දය ගණන් කිරීමේ කටයුතු නිමාවීමෙන් පසු වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයින් හෝ පක්ෂ ජයග්‍රාහකයින් වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ.**

**පක්ෂයක් ලද ඡන්ද සංඛ්‍යාවට සමානුපාතික වන අයුරින් ව්‍යවස්ථාදායකයේ ආසන ප්‍රමාණයක් ලබාදීමේ අරමුණින් සමානුපාතික ඡන්ද ක්‍රමය සැලසුම් කර තිබේ.**

2. සමානුපාතික ඡන්ද ක්‍රම ( මෙය සමානුපාතික නියෝජන ක්‍රමය යටතට ගැනේ

3. මිශ්‍ර නියෝජිත සමානුපාතික (එම්.එම්.පී.) සහ සමාන්තර ක්‍රමය මෙය මිශ්‍ර ක්‍රම පවුලට අයත් ය.

## බහුත්ව / බහුතර ක්‍රම

බහුත්ව / බහුතර ක්‍රම පිළිබඳ මූලධර්ම සරල එකකි. ඡන්දය ප්‍රකාශ කර, ඡන්ද ගණන් කිරීමේ කටයුතු නිමා වීමෙන් පසු වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයින් හෝ පක්ෂ ජයග්‍රාහකයින් වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ. (විවිධ අතිරේක කොන්දේසි තිබිය හැකි ය.) මෙම ක්‍රමය ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කිරීමේ දී විශාල වශයෙන් වෙනස් වේ. කේවල ඡන්ද කොට්ඨාශ ක්‍රමය වනාහී බහුත්ව / බහුතර මැතිවරණ ක්‍රම අතුරින් ඉතාමත්ම සරල ක්‍රමයයි. වලංගු ඡන්දවලින් නියත බහුතරයක් නොලබා ඇතත් ජයග්‍රාහී අපේක්ෂයෝ වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබනුයේ අනෙකුත් සියලු දෙනා අතුරින් වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් පුද්ගලයායි.

මේ ක්‍රමය යටතේ කේවල මන්ත්‍රී දිස්ත්‍රික්ක ක්‍රියාත්මක වන අතර ඡන්ද දායකයින් ස්වකීය ඡන්දය ප්‍රකාශ කරනුයේ හුදෙක් අපේක්ෂකයින් සඳහා මිස දේශපාලන පක්ෂ සඳහා නොවේ.

ද්විත්ව වට ක්‍රමය යනු බහුත්ව /බහුතර ක්‍රමයකි. එහි දී ප්‍රථම වටය හමාරවන විට කිසිදු අපේක්ෂකයෙකු අවශ්‍ය මට්ටමේ ඡන්ද ප්‍රමාණයක් බොහෝ විට නියත බහුතරයක් (50 %) ලබා ගැනීමට අපොහොසත් වුවහොත් දෙවන වරට මැතිවරණයක් පවත්වනු ලැබේ.

ද්විත්ව වට ක්‍රමය සාමාන්‍යයෙන් බහුත්ව / බහුතර ස්වරූපයක් ගනු ඇත. එහි දී දෙවන වටයට අපේක්ෂකයින් දෙදෙනෙකුට වැඩි සංඛ්‍යාවක් තරග කරන අතර ඉහළම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත් පුද්ගලයා තේරී පත්වන මුත් ඔවුන් නියත බහුතරයක් දිනාගැනීමට සමත් වූයේද යන්න වැදගත් නොවේ. ජයග්‍රහකයෙකු තෝරා ගැනීම සඳහා ප්‍රථම වටයේදී ඉහළින් ම ඡන්දය ලබා සිටින අපේක්ෂකයින් දෙදෙනා පමණක් දෙවන වටයේ දී තරග වැදීමද වැදගත් නොවනු ඇත.

## සමානුපාතික නියෝජන ක්‍රම

පක්ෂයක් ලද ඡන්ද සංඛ්‍යාවට සමානුපාතික වන අයුරින් ව්‍යවස්ථාදායකයේ ආසන ප්‍රමාණයක් ලබාදීමේ අරමුණින් සමානුපාතික ඡන්ද ක්‍රමය සැලසුම් කර තිබේ. සමානුපාතික ඡන්ද ක්‍රමයේ දී බහු මන්ත්‍රී කොට්ඨාශ බෙහෙවින් වැදගත් වේ. ඇතැම් රටවල මුළු රටම එක බහු මන්ත්‍රී දිස්ත්‍රික්කයක් වශයෙන් සැලකේ. අනෙකුත් රටවල මැතිවරණ දිස්ත්‍රික්ක පළාත් මත පදනම් වී ඇත. නැතහොත් මැතිවරණ දිස්ත්‍රික්කයකට සරිලන භූමි

ප්‍රමාණයක් වෙන්කර එය නිර්වචනය කිරීම මැතිවරණ කොමිසම වෙත පවරා තිබේ.

දිස්ත්‍රික්කයෙන් තේරීපත් වන නියෝජිතයන් සංඛ්‍යාව වැඩිවෙත් ම, ව්‍යවස්ථාදායකය නියෝජනය කිරීම සඳහා අවශ්‍ය අවම ඡන්ද සංඛ්‍යාව අඩු වනු ඇත. මැතිවරණ ක්‍රමය වඩාත් සමානුපාතික වෙත්ම ව්‍යවස්ථාදායකය නියෝජනය කිරීම සඳහා සුළු ජාතීන්ගේ පක්ෂවලට ලැබෙන අවස්ථා වැඩි වේ.

සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ සෑම පක්ෂයක් හෝ කණ්ඩායමක් විසින් බහු මන්ත්‍රී මැතිවරණ දිස්ත්‍රික්ක සඳහා අපේක්ෂක ලැයිස්තුවක් ඉදිරිපත් කරයි. ඡන්ද දායකයින් දේශපාලන පක්ෂයක් සඳහා ඡන්දය දෙනු ලබන අතර තමන් ලබා ඇති මුළු ඡන්ද සංඛ්‍යාවට සමානුපාතික වශයෙන් ඒ ඒ පක්ෂවලට ආසන හිමි වේ. ලැයිස්තුවල තමන් සිටින අනුපිළිවෙළ පරිදි ජයග්‍රාහී අපේක්ෂකයින් තෝරා ගැනීම 'සංවෘත ලැයිස්තු ක්‍රමය' යටතේ සිදු වේ. 'විවෘත ලැයිස්තු' ක්‍රමය යටතේ ඡන්ද දායකයින්ට ස්වකීය මනාපය ලකුණු කිරීම මගින් අපේක්ෂකයින්ගේ අනුපිළිවෙළ කෙරෙහි බලපෑම් සිදු කිරීමට පුළුවන.

තමනට රුචි අපේක්ෂකයා තෝරා ගැනීමේ දී ඡන්ද දායකයිනට වඩා පුළුල් නිදහසක් විවෘත ලැයිස්තු ක්‍රමය යටතේ ලැබෙතත් එමගින් යම් අයහපත් අතුරු ප්‍රතිඵල නො සිදු වනවාද නොවේ.

ඡන්ද දිනාගැනීමේ බලාපොරොත්තුවෙන් එකම පක්ෂයකට අයත් අපේක්ෂකයින් එකිනෙකාට එරෙහිව තරග වැදීම එබඳු අහිතකර ප්‍රතිඵලයකි. එබැවින් විවෘත ලැයිස්තු ක්‍රමයෙන් පක්ෂ අභ්‍යන්තරයේ නොයෙකුත් වියවුල් හා අර්බුද ඇතිවීමටත්, පක්ෂ කැබලිවලට බිඳීයාමටත් මඟ පෑදේ. මේ නිසා විවිධ අපේක්ෂකයින් සහිත ලැයිස්තු මගින් යම් පකෂයකට ලැබීමට ඇති වාසි නොලැබීම යාමට ද ඉඩ ඇත. විශේෂයෙන්, ඡන්ද දායකයින් සහ තේරී පත් වූ නියෝජිතයින් සහ මැතිවරණ ප්‍රතිඵලවල සමස්ත සමානුපාතිකත්වය අතර පවත්නා ශක්තිමත් සම්බන්ධතාවය මත සමානුපාතික නියෝජන ක්‍රමය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න තීරණය කරනු ලබන සාධක අතුරින් දිස්ත්‍රික්කයකින් ව්‍යවස්ථාදායකයට තේරී පත්වන නියෝජිත සංඛ්‍යාව ප්‍රබල සාධකයකි.

බොහෝ රටවල කලින් සිට පවතින පරිපාලන සඳහා වූ පළාත් වෙන් කරනු ලබන මායිම් ඉදිරියටත් අනුගමනය කිරීමටත් වර්තමානයේ දී මැතිවරණ කොට්ඨාශවලට සිදුවන අතර ඒවා මායිම් යටතේ වෙන්කර ඇති කොට්ඨාශ විශාලත්වය අතින් එකිනෙකට බෙහෙවින් වෙනස් වේ. කෙසේ වුවද, මේ තත්ත්වය යටතේ තවදුරටත් මැතිවරණ කොට්ඨාශ සීමා නිර්ණය කිරීම අවශ්‍ය නොවන අතර පවත්නා ක්‍රමය ඉදිරියටත් කරගෙන යා හැකි ය.

යම් දිස්ත්‍රික්කයට එක් පක්ෂයකින් එක් අපේක්ෂකයෙකු පමණක් තේරී පත් වුවහොත්, ඔහු පිරිමි අපේක්ෂකයෙකු වනවා පමණක් නොව වාර්ගික හෝ සමාජ කණ්ඩායම්වල සාමාජිකයෙකු ද වනු ඇත.

**විශේෂයෙන් ඡන්දදායකයින්, තේරී පත්වූ නියෝජිතයින් සහ මැතිවරණ ප්‍රතිඵලවල සමස්ත සමානුපාතිකත්වය අතර පවත්නා ශක්තිමත් සම්බන්ධතාව මත සමානුපාතික නියෝජන ක්‍රමය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න දිස්ත්‍රික්කයකින් ව්‍යවස්ථාදායකයට තේරී පත්වන නියෝජිත සංඛ්‍යාව විසින් ප්‍රධාන වශයෙන් තීරණය කරනු ලැබේ.**

**බහුත්ව / බහුතර සහ සමානුපාතික මැතිවරණ ක්‍රමවල අඩංගු සාධනීය ලක්ෂණයන්හි එකතුවක් මිශ්‍ර මැතිවරණ ක්‍රම තුළ දකිත හැකි ය.**

දෙදෙනෙක් හෝ ඊට වැඩි ගණනක් තේරී පත් වුවහොත් බොහෝ විට කාන්තාවන් හෝ සුළුජන කොටස් නියෝජනය කරන පක්ෂවලින් වැඩි අපේක්ෂකයින් සංඛ්‍යාවක් ජයග්‍රහණය කරනු ඇත. මේ ක්‍රියාවලියට විශාල දිස්ත්‍රික්ක (ප්‍රමාණයෙන් ආසන හතක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක්) සහ සාපේක්ෂ වශයෙන් පක්ෂ සුළු සංඛ්‍යාවක් උපකාරී වනු ඇත. ව්‍යවස්ථාදායකයට තේරී පත්වීම සඳහා දේශපාලන පක්ෂයක් ලැබිය යුතු අවම ජනතා සහයෝගය සියලුම මැතිවරණ ක්‍රමවල සඳහන් වේ. මෙය නෛතික වශයෙන් හෝ එසේත් නැතිනම් ගණිතමය වශයෙන් නියම කළ හැකි ය. නෛතික වශයෙන් සඳහන්ව ඇති අවස්ථාවල දී එය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සාමනුපාතික ක්‍රමය නිර්වචනය කරනු ලබන විධි විධාන හෝ නෛතික විධිවිධානවල දක්වා ඇත.

දිස්ත්‍රික්කය විසින් ව්‍යවස්ථාදායකයට තෝරා පත්කරනු ලබන නියෝජිත සංඛ්‍යාව සඳහන් කිරීමේ ක්‍රමය ඉතාමත් ම වැදගත් ය. නිදර්ශනයක් වශයෙන්, සමානුපාතික ඡන්ද ක්‍රමය භාවිතා කරන ඡන්ද කොට්ඨාශ හතරක් සහිත දිස්ත්‍රික්කයක 20% වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබාගත් ඕනෑම අපේක්ෂකයෙකු තේරී පත්වන අතර 10%ක් පමණ අඩු ප්‍රමාණයක් ලත් ඕනෑම අපේක්ෂකයෙකු තේරී පත්වීම සැක සහිත වේ.

## මිශ්‍ර මැතිවරණ ක්‍රම

බහුත්ව / බහුතර සහ සමානුපාතික මැතිවරණ ක්‍රමවල අඩංගු සාධනීය ලක්ෂණයන්හි එකතුවක් මිශ්‍ර මැතිවරණ ක්‍රම තුළ දකිත හැකි ය. වෙනස් ක්‍රම අනුගමනය කරමින් එකිනෙක හා සමසමව යන මැතිවරණ ක්‍රම දෙකක් මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් තුළ දකිත හැකි ය. එකම ඡන්ද දායක පිරිසක් ස්වකීය ඡන්දය ප්‍රකාශ කරන අතර, මැතිවරණ ක්‍රම දෙක යටතේම නියෝජිතයින් තෝරා ගැනීම සඳහා එය දායක වේ. ක්‍රම දෙකින් එකක් බහුත්ව / බහුතර මැතිවරණ ක්‍රමයයි, එනම් සුපුරුදු කේවල ඡන්ද කොට්ඨාශ ක්‍රමයයි. අනෙක සමානුපාතික ක්‍රමයයි. මිශ්‍ර මැතිවරණ ක්‍රමය දෙයාකර ය.

සමානුපාතික මිශ්‍ර නියෝජිත ක්‍රමය යන එකිනෙකට වෙනස් මැතිවරණ ක්‍රම දෙකක් මගින්, රට වැසියා සතු ඡන්දයෙන් අපේක්ෂකයින් තෝරා ගැනීමේ මිශ්‍ර ක්‍රමයයි. මැතිවරණ ක්‍රම දෙක අතුරින් එකක් සමානුපාතික ඡන්ද ක්‍රමය වන අතර, අනෙක බහුත්ව / බහුතර මැතිවරණ ක්‍රමයයි. මෙහි දී දෙවැනි ක්‍රමයෙන් සිදුවන අසමානු පාතික අඩුපාඩු පළමු ක්‍රමය, එනම් සමානුපාතික ඡන්ද ක්‍රමය මගින් සපුරාලනු ලැබේ.

සමාන්තර ක්‍රමය යනු මිශ්‍ර ක්‍රමයකි. ඒ යටතේ සුපුරුදු ලෙස සමානුපාතික ඡන්ද ක්‍රමය සහ බහුත්ව / බහුතර ක්‍රමය යන එකිනෙකට වෙනස් ක්‍රම දෙකක් හරහා (එහෙත් දෙවන ක්‍රමයේ ප්‍රතිඵල ගණන් කිරීමේ දී පළමු ක්‍රමය යටතේ වෙන් කරන ලද ආසන සංඛ්‍යාව සැලකිල්ලට ගනු නොලැබේ.) ඡන්ද දායකයින් විසින් ප්‍රකාශ කරන ලද ඡන්දය මත නියෝජිතයින් තෝරා පත් කරනු ලැබේ.

සමානුපාතික මිශ්‍ර මැතිවරණ ක්‍රමය යටතේ ලබන ප්‍රතිඵල සාමාන්‍යයෙන් සමානුපාතික ස්වරූපයක් දරනු ලබන අතර සමාන්තර ක්‍රමය යටතේ ලැබෙන ප්‍රතිඵලවල සමානුපාතිකත්වය බහුත්ව / බහුතර ක්‍රමයේ සමානුපාතිකත්වය සහ සමානුපාතික ක්‍රමයේ සමානුපාතිකත්වය අතර ස්ථානගත වනු ඇත.

## මැතිවරණ ක්‍රමවලින් අත්වන වාසි සහ අවාසි

ප්‍රධාන මැතිවරණ ක්‍රමවලින් අත්වන වාසි සහ අවාසි පහත සඳහන් චක්‍රයෙන් ලඝු කොට දක්වා තිබේ. එහෙත් ඒවායේ පැවැත්ම අවස්ථාවෙන් අවස්ථාවට සහ අනෙකුත් විවිධ තත්ත්වයන් යටතේ වෙනස් වීම්වලට භාජනය වෙමින් පවතී. නිදර්ශනයක් වශයෙන්, කේවල මැතිවරණ කොට්ඨාශ ක්‍රමය යටතේ ඡන්දය දෙන සංඛ්‍යාව වැඩි විය හැකි අතර සමානුපාතික ක්‍රමය මගින් ජනාධිපතිවරයාට ව්‍යවස්ථාදායකයෙන් ප්‍රබල සහයෝගයක් ලබා දිය හැකි ය. එසේම එක් අවස්ථාවක දී හෝ එක් පක්ෂයකට හෝ වාසියක් සැලසෙද්දී එයම වෙනස් අවස්ථාවක දී තවත් පක්ෂයකට අවාසියක් වනු ඇත. කෙසේ වුවද, මැතිවරණ ක්‍රමයක් තෝරා ගැනීමේ දී මුහුණපෑමට සිදුවන විවිධ අවස්ථා මෙම චක්‍රයෙන් පෙන්නුම් කෙරේ.

## විකල්ප මැතිවරණ ක්‍රම පහක් - වාසි සහ අවාසි

### සමානුපාතික ක්‍රමය

| වාසි | අවාසි |
|---|---|
| සමානුපාතිකත්වය<br>පරිග්‍රාහීභාවය<br>සුළුජන කොටස් නියෝජනය වේ.<br>නරක් වන ඡන්ද ප්‍රමාණය සුළුය.<br>කාන්තා නියෝජිතයින්ට තේරී පත්වීමේ වැඩි හැකියාව තිබේ.<br>සීමා මායිම් සලකුණු කිරීමේ අඩු අවශ්‍යතාවයක් තිබීම හෝ අවශ්‍යතාවක් නොමැතිවීම.<br>අතුරු මැතිවරණ පැවැත්වීමේ අවශ්‍යතාවක් නොමැත.<br>මෙරට නොසිටින හෝ ඡන්දය දීමට නොපැමිණෙන ඡන්ද දායකයින්ගේ ඡන්දය ලබා ගැනීම පහසු වේ.<br>කේවල පක්ෂ සහිත කලාප බිහිවීම සීමා කෙරේ.<br>ඡන්දය දීමේ ප්‍රවනතාව ඉහළ යාමට ඉඩ ඇත. | මැතිවරණ කොට්ඨාශ වශයෙන් නියෝජනය වීම අඩපණ වේ.<br>වගකීම පැවරීම පිළිබඳ ප්‍රශ්න මතු වේ.<br>ජනාධිපති ආණ්ඩුක්‍රම යටතේ ජනාධිපතිවරයාට ව්‍යවස්ථාදායකයෙන් අඩු සහයෝගයක් ලැබීමට බෙහෙවින් ඉඩකඩ ඇත.<br>පාර්ලිමේන්තු ක්‍රම යටතේ සභාග හෝ සුළුතර ආණ්ඩු ඇතිවීමේ ප්‍රවණතාව අධිකය.<br>දේශපාලන පක්ෂවලට වැඩි බලයක් ලබා දී තිබේ.<br>අන්තවාදී පක්ෂවලට ව්‍යවස්ථාදායකය නියෝජනය කිරීමේ ඉඩකඩ ඇතිවිය හැකියි.<br>යම් පක්ෂයක් බලයෙන් පහ කිරීමේ හැකියාවක් නොමැතිවීම. |

## කේවල ඡන්ද කොට්ඨාශ මැතිවරණ ක්‍රමය

| වාසි | අවාසි |
| --- | --- |
| ආසන වශයෙන් ප්‍රබල අයුරින් පාර්ලිමේන්තුව නියෝජනය කිරීම.<br>වගකීම් භාරය ක්‍රියාවට නැංවීම වඩාත් පහසු කරයි.<br>අවබෝධකර ගැනීම පහසු ය.<br>ඡන්ද දායකයාට තම රුචිය පරිදි අපේක්ෂකයා තෝරා ගැනීම පහසු කරයි.<br>ප්‍රබල හා මැනවින් සංවිධානය වූ විපක්ෂයකට අනුබල දෙයි.<br>අන්තවාදී කණ්ඩායම් බැහැර කරයි.<br>අපේක්ෂකයින් අතුරින් කෙනෙකු තෝරා ගැනීමට ඡන්ද දායකයින්ට අවස්ථාව ලැබේ.<br>ජනාධිපති අණ්ඩු ක්‍රම තුළ ජනාධිපතිවරයාට ව්‍යවස්ථාදායකයේ ප්‍රබල සහයෝගයක් ලබාදීමේ වැඩි හැකියාව.<br>පාර්ලිමේන්තු ක්‍රම යටතේ බහුතරයේ ආණ්ඩු පිහිටුවීමේ වැඩි හැකියාව. | සුළුතර ජන කොටස් නියෝජනය කරනු ලබන පක්ෂවලට ඉඩක් නැත.<br>සුළුජන කොටස් බැහැර කරයි.<br>කාන්තාවන්ට ඉඩක් නැත.<br>නරක් වන ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව වැඩි ය.<br>අතුරු මැතිවරණ සඳහා නිරතුරු අවශ්‍යතාව පැන නගී.<br>මැතිවරණ කොට්ඨාශ නිර්මාණය කිරීම අවශ්‍ය වේ.<br>පෞද්ගලික වාසිය සඳහා කොට්ඨාශ මායිම් වෙනස් කරවා ගැනීමේ හැකියාව තිබේ.<br>මෙරට නොසිටින හා ඡන්දය දීමට නොපැමිණෙන ඡන්ද දායකයින්ගේ ඡන්දය ලබා ගැනීම අපහසු වේ. |

## ද්විත්ව වට ක්‍රමය

| වාසි | අවාසි |
| --- | --- |
| අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා ඡන්ද දායකයින්ට දෙවන වතාවටත් අවස්ථාවක් සලසා දෙයි.<br>අනෙකුත් බහුත්ව / බහුතර ක්‍රම යටතේ සිදුවනවාට වඩා ඡන්ද බෙදීයාම අඩු වේ.<br>අවබෝධ කරගැනීම පහසු ය. | මැතිවරණ කොට්ඨාශ නිර්ණය කිරීම අවශ්‍ය වේ.<br>වැඩි වියදමක් දැරීමට සිදුවන හා පරිපාලනමය වශයෙන් නිරන්තරයෙන් අභියෝග එල්ලවන දෙවන වටයක් සඳහා යාම අවශ්‍ය වීම.<br>අතුරු මැතිවරණ සඳහා නිරන්තර අවශ්‍යතාවක් පැන නගී.<br>මැතිවරණ පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම අතර විශාල කාල පරාසයක් ඇත.<br>අසමානුපාතිකත්වය.<br>පක්ෂ ක්‍රමය කැබලිවලට බිඳ දැමීමට ඉඩ ඇත.<br>ගැඹුරින් බෙදී වෙන් වී ගිය සමාජ අස්ථායි කරනු ඇත. |

## සමාන්තර ක්‍රමය

| වාසි | අවාසි |
| --- | --- |
| පරිග්‍රාහීභාවය | සංකීර්ණ ක්‍රමයකි. |
| සුළුජන කොටස් නියෝජනය කිරීම. | මැතිවරණ කොට්ඨාශ නිර්ණය කිරීම අවශ්‍ය වේ. |
| පිරිසිදු සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ සිදුවනවාට වඩා කැබලිවලට කැඩීම අඩුවීම. | අතුරුමැතිවරණ සඳහා නිරන්තරයෙන් අවශ්‍යතා පැන නගී. |
| අනෙක් විකල්ප ක්‍රමවලට වඩා ඒකඟත්වයකට පත් වීමේ වැඩි ඉඩකඩක් ඇත. | පන්ති දෙකක නියෝජිතයින් ඇති කළ හැකි ය. |
| | උපායශීලී ඡන්දය දීමේ ක්‍රමය. |
| | සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ මෙන් නොව මෙරට නොසිටින හෝ ඡන්දය දීමට නොපැමිණෙන ඡන්ද දායකයින්ගේ ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා කටයුතු සැලසීම අපහසු ය. |
| | සමස්ත සමානුපාතිකත්වය සහතික නොකරයි. |

## සමානුපාතික මිශ්‍ර නියෝජිත ක්‍රමය

| වාසි | අවාසි |
| --- | --- |
| සමානුපාතිකත්වය | සංකීර්ණ ක්‍රමයකි |
| පරිග්‍රාහීභාවය | මැතිවරණ කොට්ඨාශ නිර්ණය කිරීම අවශ්‍ය වේ. |
| මැතිවරණ කොට්ඨාශ වශයෙන් නියෝජනය කෙරේ. | අතුරු මැතිවරණ සඳහා නිරන්තර අවශ්‍යතාවක් පැන නගී. |
| වගකීම්භාරය | පන්ති දෙකක නියෝජිතයින් ඇති කළ හැකි ය. |
| නරක් වූ ඡන්ද ප්‍රමාණය අඩු ය. | උපායශීලීව ඡන්දය දීමේ ක්‍රමය. |
| අනෙක් විකල්ප ක්‍රමවලට වඩා ඒකඟත්වයකට පත්වීම වඩා පහසු වේ. | සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ මෙන් නොව මෙරට නොසිටින හෝ ඡන්දය දීමට නොපැමිණෙන ඡන්ද දායකයින්ගේ ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා කටයුතු සැලසීම වඩා දුෂ්කර ය. |

**කාන්තා නියෝජනය වැඩි කිරීමේ බොහෝ මාර්ග තිබේ. සමානුපාතික ඡන්ද ක්‍රමය ඉන් එකකි.**

**සාමාන්‍යයෙන් සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රවණතාව අධික ය.**

## නියෝජනය සහ පරිපාලනය : වැදගත් කරුණු කීපයක්

### කාන්තා නියෝජනය

කාන්තා නියෝජනය වැඩි කිරීමේ බොහෝ මාර්ග තිබේ. සමානුපාතික ඡන්ද ක්‍රමය ඉන් එකකි. ව්‍යවස්ථාදායකයට නියෝජිතයින් වැඩිපුර සංඛ්‍යාවක් තෝරාපත් කරනු ලබන දිස්ත්‍රික්ක ප්‍රයෝජනයට ගන්නා මැතිවරණ ක්‍රම විසින් වැඩියෙන් කාන්තාවන් නම් කිරීම පිණිස දේශපාලන පක්ෂවලට අනුබල දෙති. එමගින් පක්ෂවල ඡන්ද පදනම ශක්තිමත් කිරීම අරමුණ වී තිබේ. මැතිවරණ ක්‍රම හැරුන විට කාන්තා නියෝජනය වැඩි කිරීමේ අන්‍ය ක්‍රමද තිබේ. ව්‍යවස්ථාදායකයේ ආසන සංඛ්‍යාවක් කාන්තාවන් සඳහා වෙන් කළ හැකි ය. එසේම දේශපාලන පක්ෂ යම් කාන්තා සංඛ්‍යාවක් මැතිවරණයට ඉදිරිපත් කළ යුතු යයි මැතිවරණ නීතිවලින් අවධාරණය කළ හැකි ය. එහෙත් එමගින් අපේක්ෂිත ඉලක්ක සපුරාලීමට බොහෝ විට නොහැකි වන බැවින් කාන්තාවන්ට තේරී පත්වීමට හැකිවන පරිදි පක්ෂ ලයිස්තු මගින් ඔවුන්ට නිසි තැන ලබාදීමේ යාන්ත්‍රණ පිහිටුවීම අවශ්‍ය වේ. දේශපාලන පක්ෂ තමන් සතු කාන්තාවන් සඳහා වූ කෝටා ක්‍රම ද ප්‍රයෝජනයට ගනු ඇත. මේ පිළිබඳව තවදුරටත් තොරතුරු අවශ්‍ය වේ නම් ස්ටොක්හෝම් විශ්ව විද්‍යාලයේ www.quotaprojectoorg වෙබ් අඩවියෙන් සොයා ගත හැකි ය.

### සුළුජන කොටස් නියෝජනය

සුළුජන කොටස් සහ වාර්ගික කණ්ඩායම් නියෝජනය වැඩි කිරීමේ බොහෝ ක්‍රම තිබේ. මැතිවරණයෙන් ජය ලැබීමේ අවස්ථා වැඩිවීමට ඉඩ ඇතැයි යන අපේක්ෂාවෙන් ව්‍යවස්ථාදායකයට දිස්ත්‍රික්කයේ නියෝජිතයින් විශාල සංඛ්‍යාවක් තෝරා පත් කරනු ලබන මැතිවරණ ක්‍රම විසින් සුළුජන කොටස් අතුරින් නියෝජිතයින් නම් කිරීම සඳහා දේශපාලන පක්ෂවලට අනුබල දෙනු ලබති.

තෝරාපත් කිරීම සඳහා නියම කර ඇති අවම ඡන්ද සංඛ්‍යාව තවදුරටත් පහත හෙළීම හෝ නෛතික වශයෙන් නියම කර ඇති අවම ඡන්ද සංඛ්‍යාව සහමුලින් ඉවත් කිරීම මගින් සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ අඩුවෙන් නියෝජනය වී ඇති හෝ නියෝජනය වී නොමැති කණ්ඩායම්වල නියෝජනය වැඩි කළ හැකි ය. බහුත්ව / බහුතර ක්‍රමයන් තුළ සුළුජන කොටස් සහ වාර්ගික කණ්ඩායම් සඳහා ව්‍යවස්ථාදායකයේ ආසන වෙන් කළ හැකි ය.

### මැතිවරණ ක්‍රම සහ ඡන්දය ප්‍රකාශ කිරීම

ක්‍රියාත්මකව පවතින ඡන්ද ක්‍රමය සහ ඡන්දය ප්‍රකාශ කිරීමේ මට්ටම අතර ඉතා සමීප සම්බන්ධතාවක් ඇත. සාමාන්‍යයෙන් සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රවණතාව අධික ය. එක් පක්ෂයක් ස්වකීය ජයග්‍රහණය ගැන දැඩි අපේක්ෂාවෙන් සිටින විට දී මෙන් නොව, ජාතික මැතිවරණ ප්‍රතිඵල බලාපොරොත්තු වෙන් සිටින අවස්ථාවේදී බහුත්ව

/ බහුතර ක්‍රම යටතේ ඡන්දය ප්‍රකාශ කිරීමේ වැඩි ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. ප්‍රතිඵල ඉක්මනින් ලැබේ යයි අපේක්ෂා කරනු ලබන ඒ ඒ දිස්ත්‍රික්කවල ද ඡන්දය ප්‍රකාශ කිරීමේ වැඩි ප්‍රවණතාවක් පෙන්නුම් කරයි.

## සූදානම්වීම සහ පුහුණුවීම සඳහා අවශ්‍ය කාලය

වෙනස් මැතිවරණ ක්‍රමවලට අවශ්‍ය වන යටිතල පහසුකම් සැපයීම පිණිස වැය කළයුතු කාලය ද වෙනස් වේ. නිදර්ශනයක් වශයෙන්, මැතිවරණය සම්බන්ධ ලියාපදිංචි කිරීමේ කටයුතු සහ කොට්ඨාශ මායිම් නිර්ණය කිරීම සඳහා වැඩි කාලයක් ගත කිරීමට සිදු වේ. ඒවායේ නිත්‍යානුකූලත්වය පිළිබඳ විවිධ ගැටලු ද මතු වේ. සියලු ඡන්ද දායකයින් පුද්ගලික වශයෙන් පැමිණ ඡන්දය ප්‍රකාශ කරන්නේ නම් සහ ඔවුන් සිය ඡන්දය ප්‍රකාශ කර ඇති බවට සලකුණු වී ඇත්නම් ඒ දෙකින් කොයි එකක් හෝ නොමැතිව එක් ජාතික දිස්ත්‍රික්කයක් සහිත සමානුපාතික ක්‍රමයක් ක්‍රියාත්මක කළ හැකි ය. එය එක් අන්තයකි. පිළිගත හැකි මට්ටමේ ව්‍යුහයක් ක්‍රියාත්මක වී නොමැති නම් තනි මන්ත්‍රී කොට්ඨාශ සහිත දිස්ත්‍රික්කවලින් සමන්විත බහුත්ව / බහුතර ක්‍රමයක දී ඡන්ද දායකයින් පුද්ගලිකව පැමිණ තම ඡන්දය ප්‍රකාශ කිරීම සහ ඡන්දය ප්‍රකාශ කළ බවට සලකුණු කිරීම යන දෙකම අවශ්‍ය වනු ඇත. විශේෂයෙන් නව ක්‍රම හඳුන්වා දීමේ දී, මැතිවරණ කටයුතු භාර නිලධාරීන්ට අවශ්‍ය පුහුණුව ලබාදීම සඳහා නිරන්තරයෙන් කාලය වැය කිරීමට සිදු වේ.

**විශේෂයෙන් නව ක්‍රම හඳුන්වා දීමේ දී මැතිවරණ කටයුතු භාර නිලධාරීන්ට අවශ්‍ය පුහුණුව ලබාදීම සඳහා නිරන්තරයෙන් කාලය වැය කිරීම අවශ්‍ය ය.**

## අතුරු මැතිවරණ

මැතිවරණ දෙකක් අතරේ දී ආසනයක් හිස් වූ විට පක්ෂ ලැයිස්තුවේ ඊළඟට වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබා ඇති පුද්ගලයා මගින් එම ආසන පුරප්පාඩුව පිරවීම සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ නිරායාසයෙන් ම සිදු වේ. එබැවින් අතුරු මැතිවරණ පැවැත්වීමේ අවශ්‍යතාව පාන නොනඟී. කෙසේ වුවද, බහුත්ව / බහුතර මැතිවරණ ක්‍රම යටතේ පුරප්පාඩු වන ආසනවලට අතුරු මැතිවරණයක් හරහා මන්ත්‍රීන් පත් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන ඇතුළත් කර තිබේ.

සාමාන්‍ය නියෝජිතයින් තෝරා පත් කරගන්නා අවස්ථාවේදීම, ආදේශිකයින් තෝරා ගැනීම මගින් අතුරු මැතිවරණ නොපවත්වා පුරප්පාඩු පිරවිය හැකියි. සමහර අවස්ථාවල හුදෙක් ලැයිස්තුවක් මගින් පුරප්පාඩු පුරවනවාට වඩා අතුරු මැතිවරණයක් මගින් දේශපාලන වශයෙන් වඩාත් පුළුල් බලපෑමක් සිදු කළ හැකි ය. එසේම එය බලයේ සිටින රජයේ කාර්ය සාධනය මැනීමේ සුදුසු මිණුම් දණ්ඩක් ද වනු ඇත. තවද, පාර්ලිමේන්තුවේ බල කාලය තුළ පිරවීමට තිබෙන පුරප්පාඩු සංඛ්‍යාව විශාල වේ නම් එමගින් ව්‍යවස්ථාදායකයේ සංයුතිය වෙනස් වීමට ඉඩ ඇතුවා මෙන්ම රජයේ ශක්තිය අඩු හෝ වැඩි වීමට ද හේතු වේ.

## රටින් පිට ඡන්දය

මෙය රටින් ස්ථිරව හෝ තාවකාලිකව බැහැරව සිටින පුද්ගලයින්ට තම ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා සලසා ඇති යාන්ත්‍රණයයි. ඡන්දය දීම සඳහා නියමිත ස්ථානයෙන් පිට වෙනත් ස්ථානයක හෝ වෙනත් දිනයක මෙලෙස

**දිස්ත්‍රික්ක පදනම් කරගත් විමධ්‍යගත ක්‍රම මෙන් නොව සංවෘත ලැයිස්තු මුල් කොටගත් සමානුපාතික නියෝජන ක්‍රමය විසින් යොදා ගනු ලබන විශාල වශයෙන් මධ්‍යගත වූ දේශපාලන ක්‍රමයන්ට ප්‍රබල පක්ෂ සංවිධාන දිරිමත් කිරීමේ වැඩි හැකියාවක් ඇත.**

ඡන්දය දීම සඳහා අවශ්‍ය කටයුතු සලසනු ලැබේ. කෙනෙකුට ඡන්දය තැපෑලෙන් එවිය හැකි අතර තමා විසින් බලය පවරන ලද ඒජන්තවරයකුට තම ඡන්දය ප්‍රකාශ කළ හැකි ය.

පක්ෂයක් සඳහා එකම ලැයිස්තුවක් සහිත පුළුල් ජාතික සමානුපාතික ඡන්ද ක්‍රමයක් යටතේ මෙම රටින් පිට ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමය වඩා පහසු වුවද, තනි නියෝජිතයෙකු සහිත දිස්ත්‍රික් ක්‍රමයක් යටතේ එය ක්‍රියාත්මක කිරීම ඉතා සංකීර්ණ වේ. කෙසේ වුවද, අවසානයේ දී ඔවුන්ගේ ඡන්ද ව්‍යවස්ථාදායකයාට නියෝජිතයින් තෝරා පත්කර යැවීමේ ක්‍රියාවලියට දායක වනු ඇත.

## මැතිවරණ ක්‍රම සහ දේශපාලන පක්ෂ

දිස්ත්‍රික්ක පදනම් කරගත් විමධ්‍යගත ක්‍රම මෙන් නොව සංවෘත ලැයිස්තු මුල් කොටගත් සමානුපාතික නියෝජන ක්‍රමය විසින් යොදා ගනු ලබන විශාල වශයෙන් මධ්‍යගත වූ දේශපාලන ක්‍රමයන්ට ප්‍රබල පක්ෂ සංවිධාන දිරිමත් කිරීමේ වැඩි හැකියාවක් ඇත.

රාජ්‍ය හෝ පෞද්ගලික අරමුදල්වලට ප්‍රවේශ වීමේ ප්‍රවනතාව මැතිවරණ ක්‍රම සැලසුම් කිරීම කෙරෙහි බෙහෙවින් බලපායි. එසේම එය නව දේශපාලන පක්ෂවලට හිස ඔසවා සිටීමට ඉඩ නොදෙන විශාලතම බාධකය ද වේ.

මැතිවරණ ක්‍රම තෝරා ගැනීමේ දී එය දේශපාලන පක්ෂ ක්‍රමයේ වර්ධනයට බලපාන්නාසේ ම ක්‍රියාත්මකව පවත්නා දේශපාලන පක්ෂ ක්‍රමය මැතිවරණ ක්‍රමයක් තෝරා ගැනීම කෙරෙහි බලපානු ඇත. තවද ප්‍රබල දේශපාලන අවශ්‍යතාවක් ඇතොත් මිස, තමන්ට බරපතල අවාසි ගෙන දෙන වෙනස්කම් සහ දේශපාලන පක්ෂ ක්‍රමයට පිවිසීම සඳහා නව විරුද්ධවාදී පක්ෂවලට මග හෙළි කරදෙන වෙනස්කම් සඳහා දැනට ක්‍රියාත්මකව තිබෙන පක්ෂ වෙතින් සහයෝගය නොලැබෙනු ඇත. එබැවින් මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සඳහා වූ විකල්ප ක්‍රියාත්මක කිරීම බෙහෙවින් සීමා වේ.

සාමාන්‍යයෙන් බහුත්ව /බහුතර වැනි කේවල මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ ප්‍රයෝජනයට ගනු ලබන මැතිවරණ ක්‍රම විසින් කේවල මන්ත්‍රී කොට්ඨාශ නියෝජනය කරන අපේක්ෂකයින් එම කොට්ඨාශවල ඕනෑ එපාකම් සොයා බලා ඉටු කරන පිරිසක් ලෙස සිතීමට පොළඹවනු ලබන බව පෙනේ. එහෙත් එයට ඉඳුරාම වෙනස් අයුරින් බොහෝ දුරට සමානුපාතික ඡන්ද ක්‍රමය වැනි විශාල බහු මන්ත්‍රී දිස්ත්‍රික්ක යොදා ගන්නා මැතිවරණ ක්‍රම විසින් ජාතික ප්‍රශ්නවල දී තම පක්ෂයේ ප්‍රතිපත්ති කෙරෙහි පක්ෂපාතීත්වය දක්වන නියෝජිතයින් බිහි කිරීමේ වැඩි ප්‍රවණතාවක් පෙන්වනු ලැබේ. මේ ප්‍රවේශ දෙකම සතු ඇතැම් සාධනීය ලක්ෂණ වෙත්. ඒ නිසාය, ප්‍රාදේශීය සහ ජාතික මට්ටමේ නියෝජිතයින් යන දෙගොල්ලන්ගෙන් ම සමන්විත මිශ්‍ර මැතිවරණ ක්‍රම බෙහෙවින් ජනප්‍රිය වී ඇත්තේ. විශේෂයෙන් තේරී පත් වූ කේවල

නියෝජිතයින්ට අදාළව දේශපාලන පක්ෂ සහ මැතිවරණ ක්‍රම පිළිබඳ වූ සාකච්ඡාවල දී වගකීම් භාරය පැවරීමේ ප්‍රශ්නය මතු වේ.

ඡන්ද දායකයින්, තේරී පත් වූ නියෝජිතයින් සහ දේශපාලන පක්ෂ අතර පවත්නා සමීප සම්බන්ධතා කෙරෙහි මැතිවරණ ක්‍රමය පමණක් නොව, බලයේ සිටින නිලකාලය, පක්ෂ සහ තේරී පත් වූ නියෝජිතයින් වශයෙන් කටයුතු කරන ඒවායේ සාමාජිකයින් අතර පවත්නා සම්බන්ධතා හසුරවනු ලබන විධිවිධාන හෝ ව්‍යවස්ථාදායකයෙන් ඉල්ලා අස් නොවී තේරී පත් වූ නියෝජිතයින් පක්ෂ මාරු කිරීම වළක්වන විධි විධාන වැනි දේශපාලන ව්‍යවස්ථාදායකය සතු අනෙක් විධිවිධාන විසින් විවිධ බලපෑම් සිදු කරනු ලැබේ.

දේශපාලන පක්ෂ අතුරින් මෙන් නොව, ඡන්ද දායකයින්ට අපේක්ෂකයින් අතුරින් තමන් කැමති අපේක්ෂකයා තෝරා ගැනීමේ නිදහස වගකීම් භාරය සංකේතවත් කරනු ලබන තවත් අවස්ථාවකි. නිදර්ශනයක් වශයෙන්, සමානුපාතික ඡන්ද ක්‍රමවල අඩංගු විවෘත ලයිස්තු ක්‍රම හඳුන්වා දීම මගින් පසුගිය කාලවලදී බොහෝ රටවල මැතිවරණ ක්‍රම තුළ අපේක්ෂකයා කේන්ද්‍ර කොට ගත් ඡන්දය දීමේ ක්‍රම රැසක් ක්‍රියාත්මක කරන ලදී.

**ප්‍රබල දේශපාලන අවශ්‍යතාවක් ඇතොත් මිස, තමන්ට බරපතල අවාසි ගෙන දෙන වෙනස්කම් සහ දේශපාලන පක්ෂ ක්‍රමයට පිවිසීම සඳහා නව විරුද්ධවාදී පක්ෂවලට මග හෙළිකර දෙන වෙනස්කම් සඳහා දැනට ක්‍රියාත්මක ව තිබෙන පක්ෂ සහයෝගය නොදෙනු ඇත.**

## පසුවදන : විවිධ විකල්ප සහ මූලධර්ම

මැතිවරණ ක්‍රම අධ්‍යයනය කිරීමේ දී විකල්ප ක්‍රම සඳහා පරාසය සහ එහි උපයෝගීතාව ඉතා වැදගත් කරුණු දෙකක් සේ සැලකිය හැකි ය. ලෝකයේ රටවල් පුරා ක්‍රියාත්මක වෙමින් පවතින මැතිවරණ ක්‍රම වෙතින් මේ වන විට ඡන්ද දායකයින් ලබාගෙන ඇත්තේ තුළනාත්මක අත්දැකීම් රාශියකි. නිතරම පාහේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා, දේශපාලන සහ මැතිවරණ ව්‍යුහයන් සැලසුම් කරන හා කෙටුම්පත් කරනු ලබන පිරිස් විසින් තෝරා ගනු ලැබ ඇත්තේ ඔවුන් මැනවින් දන්නා, අඳුනන ක්‍රමයන් ය. නව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් තුළ සැමවිට ම පාහේ, එම රාජ්‍යයන් යටත්ව සිටි අධිරාජ්‍යවාදීන්ගේ බල ප්‍රදේශ තුළ ප්‍රචලිතව තිබූ ක්‍රම භාවිතයට ගනු ලැබිණි. ආධාර සපයන රටවල් ඔවුන් සතු නව මැතිවරණ ක්‍රම ආධාරලාභී රටවලට දායාද කොට දුන් අවස්ථා ද වෙති. මේ කොයිම අවස්ථාවක දී හෝ විකල්ප ක්‍රම පිළිබඳ පූර්ණ වශයෙන් කරුණු හැදෑරීමක් සිදු නොවිණි.

ප්‍රධාන මූලධර්ම කීපයක් මෙහි පහත ලඝු කොට දක්වා තිබේ.

### එය සමස්ත ආයතනික ව්‍යුහයක එක් කොටසක් පමණක් බව මතක තබාගන්න

මැතිවරණ ක්‍රමය නිතර ම පාහේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සහ දේශපාලන ව්‍යුහය සමග ඉතා සමීපව බැඳී සිටින බවත්, වෙනස් ආයතනික පසුබිමක් තුළ වෙනස් ආකාරයෙන් ක්‍රියාකරන බවත් පැවසිය නොහැකි ය.

මැතිවරණ ක්‍රමය තෝරා ගැනීමේ දී විවිධ ආයතනික රටා ආදර්ශයට ගැනීම බෙහෙවින් උපකාරී වනු ඇත.

## එය සරල සහ පැහැදිලි අයුරින් පවත්වාගැනීම වටී

සාර්ථක හා තිරසාර අයුරින් සැලසුම් කෙරෙන මැතිවරණ ක්‍රම ඡන්ද දායකයාට මෙන් ම දේශපාලකයාට ද පහසුවෙන් අවබෝධ කරගත හැකි ය. ඕනාවට වඩා සංකීර්ණ වීම හැම අතින්ම අහිතකර වේ. ප්‍රතිඵල කෙරෙහි ඡන්ද දායකයා තුළ පවත්නා විශ්වාසය බිඳී යාමට ද ඉඩ ඇතුවා මෙන් ම අනපේක්ෂිත තත්ත්වයන්ට මුහුණ දීමට ද සිදු වේ.

විවිධ මැතිවරණ ක්‍රම හොඳින් හඳුනාගෙන අවස්ථාවෝචිතව කටයුතු කිරීමේ ඡන්ද දායකයා සතු හැකියාව අවතක්සේරුවට ලක් කිරීම ඒ හා සමානව ම අවදානම් සහිත ය. අවසානයේ දී ස්වකීය ඡන්දය ඉතා බුද්ධිමත් අයුරින් පාවිච්චි කිරීමේ සුවිශේෂ හැකියාව ඡන්දදායකයා සතුව තිබෙන බව පැහැදිලි ය.

## නව ක්‍රම ගවේෂණය කිරීමට පසුබට නොවන්න

අද ලෝකයේ භාවිතයට ගැනෙමින් තිබෙන බොහෝ සාර්ථක හා කාර්යක්ෂම මැතිවරණ ක්‍රම නිශ්චිත ගැටලුවලට පලදායී අයුරින් මුහුණ දී ඇති අතර තවදුරටත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමේ හැකියාව තහවුරු කර තිබේ. අනෙක් අයගේ, එනම් අසල්වැසි රටවල් සහ බෙහෙවින් වෙනස් ක්‍රම මගින් ලත් අත්දැකීම්වලින් බොහෝ දේ උගත හැකි ය.

## ව්‍යවස්ථාදායකය තුළ නියෝජනය විය යුතු වැදගත් කරුණු

බෙදී ගිය රටක් හෝ සමජාතික රටක් හෝ වේවා එහි ජීවත්වන සියලු ජන කොටස්වල අනන්‍යතාවන් ව්‍යවස්ථාදායකය තුළ නියෝජනය වීම මැතිවරණ ක්‍රමයකින් අපේක්ෂා කරනු ලැබේ.

සුළු ජන කොටස් මතවාදී, වර්ගවාදී, භාෂාමය, කලාපීය සහ ආගමික අනන්‍යතාවන් මත පදනම් වී ඇතත්, ඒ ඒ ජන කොටස්වලට ආවේණික විවිධ මතවාද සහ අභිලාෂයන් ව්‍යවස්ථාදායකය තුළ නියෝජනය වීමට ඉඩ නොලැබීමෙන්, විශේෂයෙන් සංවර්ධනය කරා පිවිසෙන රටවල ගැටුම්කාරී තත්ත්වයන් ඇතිවීමට හේතු වූ බව නොරහසකි.

## සුදුසු මැතිවරණයක් තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

යම් විශේෂ මැතිවරණ ක්‍රමයක් තෝරාගනු ලබන ආකාරය එම ක්‍රමයේ සමස්ත සුජාතභාවය තහවුරු කරලීමේ ලා බෙහෙවින් වැදගත් වේ. හුදෙක් එක් කණ්ඩායමකට ලැබිය හැකි වාසි ගැන පමණක් හිතා එළඹි තීරණයකට වඩා, අවසානයේ දී මැතිවරණ කොට්ඨාශය ද එකතු කරගනිමින් සියලුම කණ්ඩායම් හෝ ඔවුන්ගෙන් වැඩිම සංඛ්‍යාවක් සම්බන්ධ වන ක්‍රියාවලියක් සාර්ථක වීමට ඉඩ ඇති අතර සුදුසු මැතිවරණ ක්‍රමයක් තෝරා ගැනීමේ දී විවිධ පක්ෂග්‍රාහී අදහස් ඇතිවීම නොවැළැක්විය හැකි වුව ද, යම් ආයතනයක් නිසි අයුරින් පිළිගැනීම සහ එහි තිරසාර පැවැත්ම සහතික කරනු වස් දේශපාලන පක්ෂ සහ ජනතාවගේ සහයෝගය අවශ්‍ය වේ.

## මැතිවරණ ක්‍රමයේ සුජාතභාවය කෙරෙහි ප්‍රධාන පාර්ශ්වකරුවන් තුළ විශ්වාසය ගොඩනගන්න

ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයට සම්බන්ධ සියලු පාර්ශ්වයන් තුළ යෝජිත මැතිවරණ ක්‍රමයේ සුජාතභාවය පිළිබඳ විශ්වාසය ගොඩනැගීම අවශ්‍ය වන අතර භේදයකින් තොරව සැම දෙනාටම පොදුවේ ප්‍රතිඵල භුක්ති විඳීමට අවස්ථාව සැලසී ඇති බවට ද ඔවුන් තුළ විශ්වාසය ජනිත විය යුතුයි.

මැතිවරණයෙන් පරාද වූ පලියටම මැතිවරණ ක්‍රමය අසාර්ථක බවට හෙළා දැකීම නොවටී. ඒ වාගේම මැතිවරණ ක්‍රමය දෝෂ දර්ශනයට ලක් කිරීම මගින් ප්‍රජාතන්ත්‍රවාදී දේහය අක්‍රිය කිරීමට ක්‍රියා නොකළ යුතුයි.

## ඡන්දදායකයින් සතු බලපෑම් කිරීමේ හැකියාව ශක්තිමත් කළ යුතුයි

මැතිරවණයක් හරහා රජය හා රජයේ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් තමන් සතුව යම් යම් බලපෑම් කිරීමේ ශක්තියක් ඇතැයි ඡන්දදායකයන්ට අවබෝධ විය යුතුයි. මැතිවරණයක දී විවිධ පක්ෂ අතරේ හෝ වෙනස් පක්ෂවලට අයත් අපේක්ෂකයින් අතරේ හෝ එකම පක්ෂයේ අපේක්ෂකයින් අතරේ හෝ සුදුස්සෙකු තෝරා පත්කර ගැනීමට ඡන්දදායකයින්ට ඉඩ තිබේ. එසේම ජනාධිපතිවරණය, ඇතුළු උභය මන්ත්‍රී මණ්ඩලය, පහළ මන්ත්‍රී මණ්ඩලය, කලාපීය සහ අනෙකුත් පළාත් පාලන ආයතනවල මැතිවරණවල දී ඔවුන්ට වෙනත් ක්‍රමයක් යටතේ ඡන්දය ප්‍රකාශ කිරීමට හැකි වේ. හුදෙක් ව්‍යවස්ථාදායකයේ සංයුතිය තීරණය කිරීමේ දී පමණක් නොව රජයක් පිහිටුවීමේ දී ද තම ඡන්දයේ බලයෙන් තමන්ට කොතෙක් දුරට බලපෑම් සිදු කළ හැකිදැයි ඡන්ද දායකයන් තුළ විශ්වාසය ජනිත වීම වැදගත් ය.

## ශක්තිමත් දේශපාලන පක්ෂ තිරසාර ප්‍රජාතන්ත්‍රවාදයට රැකුලකි

ඡන්ද පත්‍රිකාවේ දේශපාලන පක්ෂ හෝ ආසන සංඛ්‍යාව වැඩිවත්ම ජනතාවගේ ඡන්දයෙන් ස්ථාපනය කළ හැක්කේ ශක්තිමත් හා ප්‍රබල ව්‍යවස්ථාදායකයක් නොව අසංවිධානය වූ, කොටස්වලට බිඳීගිය එකක් බැවින් කිසිවකුට හෝ අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමට නොහැකි වේ. පුළුල් පදනමක් මත ස්ථාපනය වූ ශක්තිමත් දේශපාලන පක්ෂ තිරසාර ප්‍රජාතන්ත්‍රවාදයට මහත් රැකුලෙකි.

දීර්ඝ කාලීන ස්ථායිතාව සහ කෙටිකාලීන වාසි නිතරම එකිනෙක හා නොගැළපේ

දේශපාලන රංග පීඨයේ නියැලි පුද්ගලයින් නව මැතිවරණ ක්‍රමයක් පිළිබඳව සාකච්ඡා කිරීමේ දී ඉදිරි මැතිවරණයේ දී තම පක්ෂයේ ජයග්‍රහණයට වාසිවන අන්දමේ යෝජනා ඉදිරිපත් කිරීම සිරිතයි.

එක පක්ෂයක කෙටි කාලීන ජයග්‍රහණය හෝ ආධිපත්‍යය දීර්ඝ කාලීන දේශපාලන බිඳවැටීමකට මෙන්ම සමාජය තුළ අසහනකාරී තත්ත්වයක්

ඇතිවීමට හේතුවන බැවින් මෙය නිතරම පාහේ නුවණට හුරු නැති ක්‍රියාවක් විය නොහැකියි. එලෙසම වෙනස්වන දේශපාලනික තත්ත්වයන්ට සහ නව දේශපාලන ව්‍යාපාරයන්ගේ වර්ධනයට මැතිවරණ ක්‍රම වෙතින් ප්‍රමාණවත් ප්‍රතිචාර දැක්වීම අවශ්‍ය වේ.

ප්‍රජාතන්ත්‍රවාදය මැනවින් ස්ථාවර වූ රටවල පවා ප්‍රධාන දේශපාලන පක්ෂ සඳහා ලැබෙන ජනතා සහයෝගය අඛණ්ඩව ස්ථිර මට්ටමක නොපවතී. එහෙත් නව ප්‍රජාතන්ත්‍රවාදී රටවල දේශපාලනය හැම කල්හි අතිශය ප්‍රබල ස්වරූපයක් දරන අතර පවත්නා මැතිවරණ ක්‍රමය යටතේ එක් මැතිවරණයක දී ජයග්‍රහණය කරනු ලබන පක්ෂයක් ඊළඟ මැතිවරණයේ දී අවශ්‍යයෙන් ම ජයග්‍රහණය කිරීමට අපොහොසත් වනු ඇත.

## අඩුපාඩු පසුව සපුරාලිය හැකි යයි නොසිතන්න

සියලු මැතිවරණ ක්‍රම යටතේ ජයග්‍රාහකයින් මෙන්ම පරාජය ලැබුවෝ ද වෙති. යම් මැතිවරණ ක්‍රමයක් රටක ක්‍රියාත්මක වෙමින් පවතින විට එය එරට දේශපාලන වටපිටාවේ කොටසක් බවට පත් වේ. මැතිවරණ ක්‍රමය විමර්ෂණයට ලක් කිරීමට අපේක්ෂා කරන්නේ නම්, එය නෛතික ආකෘතියක ස්වරූපයෙන් එළි දැක්වීම නුවනට හුරු ය.

## සමාජ අර්බුද කෙරෙහි ඕනෑම මැතිවරණ ක්‍රමයකින් ඇතිවිය හැකි බලපෑම තක්සේරු කරන්න

මැතිවරණ ක්‍රම සුදුසු ව්‍යවස්ථාදායකයන් සහ ජනාධිපතිවරුන් තෝරා ගැනීම සඳහා පමණක් උපයෝගී කරගන්නා යාන්ත්‍රණයක් පමණක් නොව, එය සමාජය තුළ පවත්නා අර්බුද කළමනාරකණය කිරීමේ මෙවලමක් ලෙස ද දකිත හැකි ය. ඇතැම් කරුණු යටතේ සමහර මැතිවරණ ක්‍රම විසින් දේශපාලන පක්ෂවලට තම ප්‍රධාන බලමුලුවෙන් පිට ආධාර පැතීම සඳහා අනුබල දෙනු ලබයි. අනෙක් අතට නුසුදුසු මැතිවරණ ක්‍රම උපයෝගී කර ගැනීමේ දී පවත්නා ඍණාත්මක ප්‍රවනතාවන් තවදුරටත් උත්සන්න වීම සිදු වේ. ඕනෑම දේශපාලන ආයතනයක් සැලසුම් කිරීමේ දී එය සමාජය තුළ පවත්නා නොසන්සුන්කාරී තත්ත්වයන් අඩු කිරීමට උපකාරී නොවුවත්, අඩුතරමින් පවත්නා තත්ත්වය උග්‍ර අතට නොහැරවීමට වගබලාගත යුතුයි.

## පැන නැගිය හැකි අසාමාන්‍ය හා අනපේක්ෂිත අවස්ථා ගැන කල්පනාකාරී වන්න

මැතිවරණ ක්‍රම සැලසුම් කිරීමේ දී මුල් අවස්ථාවේ දී ම පහත සඳහන් ප්‍රශ්න සම්බන්ධයෙන් සැලකිලිමත් වීම බෙහෙවින් ප්‍රථිපල සහිත විය හැකි ය. අවසාන ප්‍රතිඵලය කුමක් විය හැකිදැයි තීන්දු කිරීමට හැකිවනු පිණිස යෝජිත මැතිවරණ ක්‍රමය ප්‍රමාණවත් අයුරින් පැහැදිලි කර නොතිබේ ද, නැතහොත් අවශ්‍ය විස්තර සපයා නොතිබේද? එක පක්ෂයකට සියලුම ආසන ජයග්‍රහණය කළ හැකිද? ව්‍යවස්ථාදායකයේ තිබෙන ආසන ප්‍රමාණයට වඩා වැඩි සංඛ්‍යාවක් ලබාදීමට සිදුවුවහොත් තත්ත්වය කුමක් වේද? අපේක්ෂකයින් සමාන ඡන්ද සංඛ්‍යාවක් ලබාගතහොත් ගතයුතු ක්‍රියාමාර්ගය කුමක්ද?

සමහර දිස්ත්‍රික්කවල පක්ෂ ආධාරකරුවකු විසින් තමන්ගේ වැඩි මනාපය තිබෙන පක්ෂයට හෝ අපේක්ෂකයාට ඡන්දය දීමෙන් වැළකී සිටීම වඩාත් මැනවැයි කියා මැතිවරණ ක්‍රමය අදහස් කරන්නේද?

## තෝරාගත් මැතිවරණ ක්‍රමය තිරසාරව පවත්වාගෙන යා යුතුයි

තෝරාගනු ලැබූ මැතිවරණ ක්‍රමය, පරිශීලනය කිරීමේ දී මිනිස් බලය සහ ජාතික අයවැය ලේඛනයෙන් සැපැයෙන මූල්‍ය සම්පත් අත්‍යාවශ්‍ය වේ. මෙම අවශ්‍යතාව අඛණ්ඩව සපුරාලිය හැකිද? එසේනම් එය යුක්ති සහගතද?

## මැතිවරණ ක්‍රම සැලසුම් කිරීමේ දී පරීක්ෂාවට ලක්විය යුතු ප්‍රධාන කරුණු

මැතිවරණ ක්‍රමය පැහැදිලිද? අවබෝධ කරගත හැකිද?

අනාගත ප්‍රතිසංස්කරණ සඳහා වූ යාන්ත්‍රණ සංකීර්ණ නොවන්නේද?

ඡන්දදායකයින් අවතක්සේරුවට ලක් කිරීමට මැතිවරණ ක්‍රමයෙන් ඉඩ නොලැබෙන්නේද?

මැතිවරණ ක්‍රමය හැකිතාක් දුරට පරිග්‍රාහී වී තිබේද?

මැතිවරණ ක්‍රම සැලසුම් කිරීමේ ක්‍රියාවලිය සාධාරණ බවට හැඟෙන්නේද?

මැතිවරණ ප්‍රතිඵල සාධාරණ බව පෙනේද?

අසාමාන්‍ය අනපේක්ෂිත අවස්ථා සැලකිල්ලට භාජනය වී තිබේද?

මැතිවරණ ක්‍රමය පරිපාලනමය සහ මූල්‍යමය වශයෙන් තිරසාර පදනමක පිහිටා තිබේද?

ඡන්දදායකයින්ට තමන් බලවත් යයි හැඟෙන්නේද?

තරගකාරී පක්ෂ ක්‍රමයකට අනුබල ලැබේද?

සමස්තයක් වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා රාමුවට මැතිවරණ ක්‍රමය හොඳින් අනුරූප වන්නේද?

අර්බුද උග්‍ර කිරීම වෙනුවට, එය බැහැර කරලීමට මැතිවරණ ක්‍රමය උපකාරී වන්නේද?

## ගැටපද විවරණය

### ඡන්ද පත්‍රිකාවේ ව්‍යුහය

මැතිවරණයක දී ඡන්ද දායකයාගේ මනාපය ඡන්ද පත්‍රිකාවේ ප්‍රකාශ වෙන ආකරය මින් නිරූපනය වේ. මෙහි දී ඡන්ද පත්‍රිකාව අපේක්ෂකයා හෝ පක්ෂය මූලික කොට ගෙන තිබේ ද යන්න විශේෂ වේ.

### මැතිවරණ කොට්ඨාශ මායිම් නිර්ණය කිරීම

රටක්, ප්‍රාදේශීය බලමණ්ඩල ප්‍රදේශයක් හෝ ජාතික සීමා ඉක්ම වූ ආයතනයක් මැතිවරණ කොට්ඨාශවලට කඩා වෙන් කරන ආකාරය මින් අදහස් වේ.

### අපේක්ෂක මූලික ඡන්ද පත්‍රිකාව

පක්ෂ හෝ දේශපාලන කණ්ඩායම් වෙනුවට ජනතාව විසින් මැතිවරණය සඳහා ඉදිරිපත් වී සිටින අපේක්ෂකයින් තෝරා ගැනීම සඳහා යොදා ගැනේ.

### සංවෘත ලැයිස්තුව

පක්ෂ අපේක්ෂක ලැයිස්තුව තුළ අපේක්ෂකයෙකු සඳහා මනාපය දැක්වීමට ඉඩ නොසලසා, හුදෙක් පක්ෂයකට හෝ දේශපාලන කණ්ඩායමකට පමණක් ඡන්දය දීම සීමා කරන සමානුපාතික මැතිවරණ ක්‍රමයකි.

### හානිපූරක ආසන

සාමාන්‍යයෙන් බහුත්ව / බහුතර ක්‍රම ප්‍රකාර සමානුපාතික මිශ්‍ර නියෝජිත ක්‍රමයේ පළමු කොටස යටතේ පවත්වන ලද මැතිවරණයේ ප්‍රතිඵලවල සඳහන් පක්ෂ හෝ කණ්ඩායම්වල නියෝජනය තුළ සිදු වී ඇති අසමානුපාතිකත්වය නිවැරදි කිරීම සඳහා සමානුපාතික නියෝජන ක්‍රමය මගින් සැපයෙන ආසන, හානිපූරක ආසන වශයෙන් ගැනේ.

### අසමානුපාතිකත්වය

මැතිවරණයකට සහභාගි වූ පක්ෂ සහ දේශපාලන කණ්ඩායම් සඳහා ආසන වෙන්කර දී මේ දී සමානුපාතිකත්වයට පිටු පා යන සීමාව

### දිස්ත්‍රික්කය

මින් මැතිවරණ දිස්ත්‍රික්කය අදහස් කෙරේ.

දිස්ත්‍රික්කයේ විශාලත්වය

මැතිවරණ දිස්ත්‍රික්කයක් සඳහා තෝරා ගනු ලබන නියෝජිතයින්ගේ සංඛ්‍යාව මෙයින් කියැවේ.

## මැතිවරණ දිස්ත්‍රික්කය

මැතිවරණ කටයුතු අරභයා රටක්, ප්‍රාදේශීය අධිකාරියක් හෝ ජාතික සීමා ඉක්මවනු ලබන ආයතනයක් බෙදා වෙන් කරනු ලබන භූගෝලීය ප්‍රදේශයන්ගෙන් එකකි. මැතිවරණ දිස්ත්‍රික්කයක් විසින් මන්ත්‍රණ සභාවක් සඳහා නියෝජිතයින් එකකු හෝ වැඩි දෙනෙකු තෝරා ගනු ලැබේ. කේවල මන්ත්‍රී දිස්ත්‍රික්ක සහ බහු මන්ත්‍රී දිස්ත්‍රික්ක බලන්න.

## ආසන සංඛ්‍යාව ගණන් බැලීමේ ක්‍රමය

ඡන්දදායකයින් විසින් මැතිවරණයක දී ප්‍රකාශ කරනු ලබන ඡන්ද මන්ත්‍රී ආසන බවට පත් කිරීමේ ක්‍රමයයි.

## මැතිවරණ නීතිය

දේශපාලන ආයතන තෝරාපත් කරගැනීමේ සමස්ත ක්‍රියාවලිය ආවරණය වන අයුරින් රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හෝ ආයතනික ව්‍යුහයට ඇතුල් කර ඇති ව්‍යවස්ථාව මැතිවරණ නීතියයි.

## මැතිවරණ කළමනාකරණ ආයතනය

මැතිවරණ පවත්වාගෙන යාමේ වගකීම පැවරී ඇති සංවිධානය වශයෙන් මෙය හැඳින්විය හැකි ය. බෙහෝ රටවල මෙය ස්වාධීන මැතිවරණ කොමිසමක් හෝ රජයේ වෙනම දෙපාර්තමේන්තු ශාඛාවක් වශයෙන් ක්‍රියා කරයි.

## මැතිවරණ ක්‍රමය

යම් මන්ත්‍රණ සභාවකට පක්ෂ සහ අපේක්ෂකයින් තේරී පත්වීම නිගමනය කරනු ලබන මැතිවරණ නීතියේ සහ රෙගුලාසිවල එක් අංශයක් වශයෙන් මෙය හැඳින්විය හැකියි.

ආසන සංඛ්‍යාව ගණන් බැලීම, ඡන්ද පත්‍රිකාවේ ව්‍යුහය සහ මැතිවරණ දිස්ත්‍රික්කය සඳහා තෝරා පත් කළ යුතු නියෝජිත සංඛ්‍යාව යන මේවා මැතිවරණ ක්‍රමයේ වැදගත් අංශයෝ වෙති.

## මැතිවරණ කොට්ඨාශය

මෙයට තේරුම් දෙකින් එකක් ඇත.

(අ) මැතිවරණ දිස්ත්‍රික්කය තුළ ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ලියාපදිංචි වී ඇති මුළු ඡන්දදායකයින්ගේ සංඛ්‍යාව

(ආ) විශාල වශයෙන් ඉංග්‍රීසි භාෂාව කථා කරන සමහර රටවල පාවිච්චි කෙරෙන 'මැතිවරණ දිස්ත්‍රික්කය' වෙනුවට යොදාගන්නා පදයකි 'මැතිවරණ කොට්ඨාශය'

## රටින් බැහැරව සිටින ඡන්දදායකයින්ගේ ඡන්දය දීමේ ක්‍රමය

තාවකාලිකව හෝ ස්ථිර වශයෙන් රටින් බැහැරව සිටින පුද්ගලයන්ට ස්වකීය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා යොදා ඇති යාන්ත්‍රණයයි.

## කේවල මන්ත්‍රී කොට්ඨාශ දිස්ත්‍රික්ක ක්‍රමය

මෙයට බහුත්ව / බහුතර මැතිවරණ ක්‍රමයේ දැක්වෙන ඉතා ම සරල ක්‍රමයකි. මෙහි දී කේවල මන්ත්‍රී කොට්ඨාශ දිස්ත්‍රික්ක සහ අපේක්ෂකයා සඳහා ඡන්දය දීම මෙහි ප්‍රධාන අංගයයි. අනෙකුත් සියලු අපේක්ෂකයින් අභිබවා ඡන්දය ලබාගත් අපේක්ෂකයා ජයග්‍රාහකයා වශයෙන් තීන්දු වේ. කෙසේ වුව ද, වලංගු ඡන්දවලින් ලබා ඇති නියත ජයග්‍රහණයක් ලෙස එය සැලකිය නොහැකි ය.

## පෞද්ගලික වාසි තකා ඡන්ද කොට්ඨාශ මායිම් වෙනස් කිරීම

කිසියම් දේශපාලන පක්ෂයක් විසින් වාසි හෝ අවාසි අරමුණු කොටගෙන මැතිවරණ දිස්ත්‍රික්කවල මායිම් වෙනස් කිරීම මින් ඇඟ වේ.

## සමානුපාතික ඡන්ද ක්‍රමය

මේ ක්‍රමය යටතේ සෑම පක්ෂයක් හෝ කණ්ඩායමක් මැතිවරණ කොට්ඨාශයක් වෙනුවෙන් අපේක්ෂක කණ්ඩායමක ලැයිස්තුවක් ඉදිරිපත් කරයි. ඡන්ද දායකයෝ පක්ෂයක් සඳහා සිය ඡන්දය ප්‍රකාශ කරති. ඒ අනුව ලබා ඇති ඡන්ද සංඛ්‍යා වේ. තමනට හිමි ප්‍රතිශතයට සමානුපාතික ව පක්ෂවලට ආසන හිමි වේ. ලැයිස්තුව මගින් ජයග්‍රාහක අපේක්ෂකයින් තෝරා පත් කෙරේ.

## පහළ මන්ත්‍රී මණ්ඩලය

මෙය ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රණ සභා දෙකෙන් එකකි.

මෙය ''ජනතා නියෝජිතයින්ගෙන්'' සමන්විත වනවා පමණක් නොව වඩා ප්‍රබල මන්ත්‍රණ සභාව ද වේ.

## බහුතරවාදී

මෙය නියත බහුතරයක් ලබාගැනීම සඳහා සැලසුම් කර තිබේ. (ඡන්ද සංඛ්‍යාවෙන් 50% + 1)

## සමානුපාතික මිශ්‍ර නියෝජිත ක්‍රමය

මෙය මිශ්‍ර ක්‍රමයකි. සියලුම ඡන්දදායකයින් ප්‍රථම මැතිවරණ ක්‍රමය ප්‍රයෝජනයට ගනිමින් තේරී පත් වූ මන්ත්‍රණ සභාවක් සඳහා නියෝජිතයින් සමහරක් තෝරාපත්කර ගනිති. ඊළඟට දෙවන මැතිවරණ ක්‍රමය, එනම්

සමානුපාතික ක්‍රමය යටතේ ඉතිරි ආසන පක්ෂ සහ කණ්ඩායම්වලට වෙන් කිරීම මගින් ප්‍රථම මැතිවරණ ක්‍රමයේ ප්‍රතිඵලවලින් සිදු වූ අසමානුපාතිකත්වය සඳහා හානිපූරණය කරනු ලැබේ.

## මිශ්‍ර ක්‍රමය

මේ ක්‍රමය මගින් ඡන්දදායකයින් විසින් ප්‍රකාශ කරන ලද ඡන්ද උපයෝගී කරගෙන සමානුපාතික නියෝජන ක්‍රමය සහ බහුත්ව / බහුතර යන ක්‍රම දෙක යටතේ නියෝජිතයින් තෝරාපත්කරගනු ලැබේ. මිශ්‍ර ක්‍රමය වර්ග දෙකකි. එනම්, සමාන්තර ක්‍රම සහ සමානුපාතික නියෝජන ක්‍රම වේ.

## බහු මන්ත්‍රී දිස්ත්‍රික්ක

ව්‍යවස්ථාදායකයට හෝ මන්ත්‍රණ සභාවකට නියෝජිතයින් එකකට වැඩි සංඛ්‍යාවක් තෝරා පත්කෙරෙන දිස්ත්‍රික්කයකි. කේවල මන්ත්‍රී දිස්ත්‍රික්ක බලන්න.

## විවෘත ලැයිස්තුව

සමානුපාතික ඡන්ද ක්‍රමයකි. මෙහි දී ඡන්දදායකයින්ට පක්ෂයක් සහ කණ්ඩායමක් යන දෙක සඳහා ම සහ පක්ෂය හෝ කණ්ඩායම තුළ එකකු හෝ සමහර විට ඊට වැඩි අපේක්ෂක සංඛ්‍යාවකට තම මනාපය ප්‍රකාශ කළ හැකි ය.

## සමාන්තර ක්‍රමය

මිශ්‍ර ක්‍රමයකි. ඡන්දදායකයින්ගේ ප්‍රකාශිත ඡන්ද මගින් එකිනෙකට වෙනස් ක්‍රම දෙකකක් හරහා නියෝජිතයින් තෝරා ගැනේ. එක් ක්‍රමයක් බහුත්ව / බහුතර ක්‍රමයයි.

අනෙක සමානුපාතික නියෝජන ක්‍රමයයි. එහෙත් මෙහි දී දෙවන ක්‍රමයේ ප්‍රතිඵල ගණන් කිරීමේ දී ප්‍රථම ක්‍රමය යටතේ වෙන් කරන ලද ආසන පිළිබඳව සැලකිල්ලක් නොදැක්වේ. සමානුපාතික මිශ්‍ර නියෝජිත ක්‍රමය බලන්න.

## පක්ෂ මූලික ඡන්ද පත්‍රිකාව

මෙම ඡන්ද පත්‍රිකාව මගින් ඡන්දදායකයින් විසින් තනි අපේක්ෂකයින් තෝරාගැනීම වෙනුවට කණ්ඩායම් හෝ පක්ෂ අතර තේරීම් සිදු කරනු ලැබේ.

## බහුත්ව / බහුතර ක්‍රම

අන් කවර හෝ අපේක්ෂකයකු නොලැබූ තරම් වැඩි ඡන්ද සංඛ්‍යාවක් හෝ 50% + 1 නියත බහුතරයක් ලබාගත් අපේක්ෂකයකු / අපේක්ෂකයින් පක්ෂයක් හෝ පක්ෂ ජයග්‍රාහකයින් වශයෙන් ප්‍රකාශයට පත් කෙරෙන මූලධර්මය බහුත්ව / බහුතර ක්‍රමයට පදනම් වී තිබේ.

## සමානුපාතික ඡන්ද ක්‍රමය

පක්ෂයක් හෝ කණ්ඩායමක් ලබාගත් මුළු ඡන්ද සංඛ්‍යාවට සමානුපාතික ව ආසන සංඛ්‍යාවක් ලබාදීමේ මූලධර්මය මත මෙම ක්‍රමය පිහිටා තිබේ. ඡන්ද සංඛ්‍යාවෙන් 30% ලබාගත් පක්ෂයකට, දළ වශයෙන් 30% ක ආසන ප්‍රමාණයක් හිමි වේ. සියලු සමානුපාතික මැතිවරණ ක්‍රම සඳහා බහු මන්ත්‍රී දිස්ත්‍රික්ක අවශ්‍ය වේ.

## කෝටා ක්‍රමය

මේ සඳහා පහත සඳහන් දෙකින් එකක් අර්ථවත් වේ.

අ. සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ කිසියම් මැතිවරණ කොට්ඨාසයක් තුළ පක්ෂයකට හෝ අපේක්ෂකයකුට ආසනයක් දිනාගැනීම සහතික කිරීමේ ක්‍රමයයි.

ආ. තේරී පත් වූ මන්ත්‍රණ සභාවේ යම් ආසන සංඛ්‍යාවක් හෝ පක්ෂයක් / කණ්ඩායමක් විසින් සමානුපාතිකව නම් කරන ලද අපේක්ෂකයින් ප්‍රමාණයක් (මොවුන් සියලු දෙනා එක්තරා සුවිශේෂී කණ්ඩායමක් අතුරින් පිරවිය යුතු යයි නීතියක් දක්වා තිබේ. උදාː කාන්තාවන් ද කෝටාව වශයෙන් සැලකේ.)

## කේවල නියෝජිත දිස්ත්‍රික්ක

ව්‍යවස්ථාදායක හෝ තේරී පත් වූ මන්ත්‍රණ සභාවක් සඳහා එක නියෝජිතයෙක් පමණක් තෝරා පත්කරනු ලබන මැතිවරණ දිස්ත්‍රික්කයයි. බහු මන්ත්‍රී කොට්ඨාසය ද බලන්න.

## නියෝජනය සඳහා අවශ්‍ය අවම ඡන්ද සංඛ්‍යාව

යම් පක්ෂයකට ව්‍යවස්ථාදායකයට තේරී පත් වීම සඳහා අවශ්‍ය අවම ඡන්ද සංඛ්‍යාව මින් අදහස් කෙරේ. මෙය දෙයාකාරීයි.

එක් ක්‍රමයක් යටතේ අවශ්‍ය ඡන්ද සංඛ්‍යාව, එනම් ප්‍රකාශ කරන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් ලැබිය යුතු ප්‍රතිශතය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ හෝ නීතිය මගින් සඳහන් කර තිබේ.

ක්‍රියාත්මකව පවත්නා මැතිවරණ ක්‍රමය යටතේ ගණිතමය වශයෙන් තීරණය කරනු ලබන ප්‍රමාණය අනෙක් ක්‍රමයයි.

## ද්විත්ව වට ක්‍රමය

මෙය ද බහුත්ව / බහුතර ක්‍රමයකි. ප්‍රථම වටයේ දී කිසිම අපේක්ෂකයකු අවශ්‍ය ප්‍රමාණයට ඡන්ද ලබා ගැනීමට අපොහොසත් වුවහොත්, එනම් බහුල

වශයෙන් 50% + 1 නියත බහුතරයක් ලබාගැනීමට නොහැකි වුවහොත් දෙවන මැතිවරණයක් පවත්වනු ලැබේ.

ද්විත්ව වට ක්‍රමය යටතේ දෙවන වටයේ දී අපේක්ෂකයින් දෙදෙනකුට වැඩි සංඛ්‍යාවකට තරග කළ හැකි ය. එහි දී වැඩි ම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයා ජයග්‍රාහකයා වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ. නියත බහුතරයක් ලබාගත්තේ ද, නැද්ද යන්න මෙහි දී ප්‍රශ්නයක් නොවනු ඇත.

විකල්ප වශයෙන් ද්විත්ව වට ක්‍රමය යටතේ ප්‍රථම වටයේ දී ඉහළින් ම ඡන්ද ලබාගත් අපේක්ෂකයින් දෙදෙනා දෙවන වටයට තරග කරනු ඇත.

## උභය මන්ත්‍රී මණ්ඩලය

ද්විමංඩල ව්‍යවස්ථාදායකයේ එක් මන්ත්‍රී මණ්ඩලයකි. බොහෝ විට මෙය කලාපීය / පෙඩරල් ප්‍රාන්ත නියෝජිතයින් ගෙන් සමන්විත වේ. නැතහොත් මෙය අණ පනත්, ප්‍රතිපත්ති, තීරණ යනාදිය විමර්ෂණයට ලක් කෙරෙන මන්ත්‍රණ සභාවක් වශයෙන් කටයුතු කරනු ඇත. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හමුවේ මෙය බලතල අඩු මට්ටමකින් පවතී.

## නරක් වූ ඡන්ද පත්‍රිකා

මේවා වලංගු ඡන්ද වුව ද, අපේක්ෂකයකු හෝ පක්ෂයක් තේරී පත්කිරීමේ දී සැලකිල්ලට ගනු ලබන ඡන්දවලට අයත් නොවේ.